කාණ්ඩය 1 | කලාපය III | 2010 සැප්තැම්බර් - ඔක්තොම්බර් | ISSN 2012 - 7189




▶ කෞතුකාගාර

ගාල්ල සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරය …………2





▶ සංවාද

මහාචාර්ය ආරිය ලගමුව …………5





▶ අනාවරණ

ස්ටෝන් හෙන්ජ් නිඹුල් සොහොයුරා ………… 12


# ශ්‍රී ලාංකේය පුරාවිද්‍යාව
# දිනිති

මානව යටගියාවේ අක්මුල් සොයා යන ද්විමාසික විද්‍යුත් සඟරාව

## සකසු සටහන



*දිනිති - ශ්‍රී ලංකා පුරාවිද්‍යාව* ද්විමාසික විද්‍යුත් සඟරාව ලොව වටා දහස් ගණනක පාඨක පිරිසක් ආමන්ත්‍රණය කරමින් ජනප්‍රියත්වයක් අත්කර ගනිමින් පවතී. *දිනිති* ශ්‍රී ලංකා පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ කථිකාවක් ඇරඹීම සඳහා ද මූලික වී තිබීම වැදගත් කරුණකි. මෙම කථිකාව ප්‍රාමාණික විද්වතුන් රැසකගේ සක්‍රීය දායකත්වය සහිතව ඉදිරියට වඩා හොඳින් පවත්වාගෙන සඳහා කටයුතු සම්පාදනය කරමින් සිටී. දිනිති උසස් මට්ටමකින් ගෙන ඒමට දායක්වය දැක් වූ සියල්ලන්ටම දිනිති කණ්ඩායමේ අතිශය ස්තූතිය පුදකිරීමට මෙය අවස්ථාවක් කර ගැනේ.

සීගිරි බිතුසිතුවම් සංරක්ෂයේ පැවැති ගැටළුකාරී තත්වය මෑත කාලයේ පොදු ජනයා අතර සංවාදයක් ආරම්භ වීමට ඉවහල් වී ඇත. සීගිරි සිතුවම් සංරක්ෂණයේ පැවැති ප්‍රශ්නකාරී තත්වය පිළිබඳව ජනමාධ්‍ය ආයතනයක විමසුමකට පිළිතුරු දෙමින් අදාළ සංරක්ෂණ නිලධාරීයා ප්‍රකාශ කළේ මාධ්‍ය මඟින් මහජනයා වෙත වැරදි තොරතුරු ගෙනයන බවයි. එහෙත් සැබෑ ලෙසම සීගිරියේ සිතුවම් සම්බන්ධයෙන් ගැටළුකාරි තත්වයක් ඇති වූ බව ජනාධිපතිතුමා ප්‍රස්තුත කාරණය සඳහා මැදිහත් වීම ඔස්සේ තහවුරු විය. මහජන උරුමයේ කොටසක් වන පුරාවිද්‍යා උරුමය මෙන්ම ඒහි ආරක්‍ෂාව, ක්‍රියාකාරීත්වය, සංරක්‍ෂණය පමණක් නොව පර්යේෂණ සම්බන්ධ විස්තර හා තොරතුරු දැනගැනීමේ අයිතිය මහජනයා වෙත ඇති බව විශ්වීය වශයෙන් පිළිගත් කරුණකි. පුරාවිද්‍යාත්මක උරුමය යනු එක් අතකින් මහජනයාගේම උරුමයයි. අනෙක් අතින් මේ සඳහා වැයකරන්නේ මහජන මුදල් හා සම්පත්ය. අදාළ නිලධාරීන් ලබන වැටුප පවා මහජන බදු මුදලින් ගෙවනු ලබන්නකි. එබැවින් මහජනයාට උරුමය සම්බන්ධයෙන් දැනුවත් වීමට පමණක් නොව එය නිසි ආකාරයට කළමනාකරණය නොවන විට ඊට එරෙහි වීමට පවා අයිතියක් ඇත.

ජාතික උරුමය පටු ආකල්ප අනුව අර්ථදැක්වීමට උත්සාහ දරන ඉතා සුළුතරයක් වූ උරුම ක්‍රියාකාරිකයන් මේ බව අවබෝධ කරගැනීම ජාතියේ පමණක් නොව සමස්ත මානව වර්ගයාගේම යහපතට හේතු වනු ඇත. කුමක් නිසාද යත් ජාතික උරුමය යනු අවසාන වශයෙන් ජගත් මානනවයාගේ පරිණාමය පිළිබඳ සාධකයක් වන බැවිනි.
සංස්කාරක


archaeology.lk
දොරට වැඩුමකි

(නොමිලේ බෙදාහැරෙන්නකි)

මෙහි පළවන ලිපිවලින් දැක්වෙන්නේ ඒ එක් එක් ලේඛකයාගේ අදහස් බව සැලකුව මනාය.

**සංස්කරණය**
චන්දිම අඹන්වල

**සංස්කාරක මණ්ඩලය**
අනුරාධ පියදාස
සන්ධ්‍යා නවරත්න-මැණිකේ

**කර්තෘ මණ්ඩලය**
මහින්ද කරුණාරත්න

**අංකිත සිතුවම්කරණය**
අනුරාධ පියදාස

**අක්ෂර සංයෝජනය**
මහින්ද කරුණාරත්න
චන්දිම අඹන්වල

**විවිධ සහාය**
රුක්ෂිලා වෙත්තමුණි
ලක්ෂ්මී විජයරත්න



**විද්‍යුත් ලිපිනය**
dinithi@archaeology.lk

**ලිපිනය**
සංස්කාරක
දිනිති - ශ්‍රී ලංකා පුරාවිද්‍යාව
අංක 47,
ශ්‍රී සුමංගල මාවත-දකුණ,
කළුතර-උතුර



# ගාල්ල සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරය

සටහන

**සන්ධ්‍යා කුමාරි නවරත්න මැණිකේ**
ගාල්ල සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරයේ කෞතුකාගාර නිලධාරී

දක්ෂිණ ලංකාද්වීපයේ ඓතිහාසික ගාලුපුර කොටු පවුරෙහි පිහිටි ඕලන්ද වාස්තුවිද්‍යාත්මක ශෛලීනට අනුකූලව ඉදිකරන ලද ලන්දේසී බඩුගබඩා ගොඩනැගිල්ලහි (පැක් හවුස්) විවෘතව පවතින සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරය ශ්‍රී ලංකාවේ ප්‍රථම හා එකම සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරය වශයෙන් ඉතිහාසයට එක්ව ඇත. ශ්‍රී ලංකා-නෙදර්ලන්ත සහයෝගීතා ව්‍යාපෘතිය යටතේ නෙදර්ලන්ත රජයෙහි මුල්‍යාධාර හා ශ්‍රී ලංකා ජන රජයෙහි සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යංශයත් මධ්‍යම සංස්කෘතික අරමුදල එක්ව



සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාර ලාංඡනය

නිර්මිත ගාල්ල සමුද්‍රපුරා විද්‍යා කෞතුකාගාරය ක්‍රිස්තු වර්ෂයෙන් 2010. මාර්තු මස 04 වන දින සිට ජනතා ප්‍රදර්ශනයට විවෘතව පවතී. කෞතුකාගාර නිර්වචනය හා විෂය පථයට අනුකූලනයවන පරිදි මෙරට ඓතිහාසික ශ්‍රී විභූතිය අවලෝකනයට හා ප්‍රදර්ශනයට මෙහිදි හැකියාව ලැබී තිබේ.
සෞන්දර්යාත්මක මෙන්ම ස්වභාවික සම්පත් සංකේන්ද්‍රිත භූමිභාගයකින් යුත් ශ්‍රී ලංකාව පුරාණ කාලයෙහි පටන්ම ඉන්දීය සාගරය හරහා ගමන්ගිය දුරුරට වාසීනට කේන්ද්‍රීය සංධිස්ථානයක් වී ඇත. ඉන්දීය උප මහද්වීපයට දක්ෂිණාර්ථවත් ඉන්දීය සාගරයේ මධ්‍යගතවත් පිහිටි ශ්‍රී ලංකාව ඉන්දීය සාගර ලෝකයේ නානාවිධ නාලිකා ඔස්සේ ක්‍රියාකාරකම් හැසිර වූ විදේශීය ජාතීන්ගේ ආකර්ෂණයත් අවධානයත් දිනා ගැනීමට සමත් වී ඇත. එහි ප්‍රතිඵල මත විවිධ අපේක්ෂා හා අභිමතාර්ථයන් මුදුන් පමුණුවා ගනුවස් ඉන්දීය සාගර ලෝකයේ සැරිසැරූ ගමන් වාර අතරමඟ ශ්‍රී ලංකා භූමියෙහි පා තබන්නට බොහෝ දෙනෙක් අමතක නොකළ බව ශේෂිත පුරාවිද්‍යාත්මක සාධකයන් සාක්ෂි දරනු ඇත. මේ සියලු සංස්කෘතික සබඳතාවයන් විද්‍යාත්මක පසුබිමක සිට වඩාත් අර්ථාන්විතවත් අධ්‍යාත්මිකවත් හදාරන්නට ගාල්ල සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරයෙන් අවකාශ සැලසෙනු ඇත.
ක්‍රිස්තු පූර්ව පළමුවන සියවසෙහි පටන් දහනව වන සියවසෙහි අවසානය දක්වා වූ දීර්ඝ කාලපරිච්ඡේදයෙහි යථොක්ථ සමාජ සන්දර්භයෙහි යටගියාව හා ඓතිහාසික උරුමයන් අනාගත පරපුර උදෙසා දයාද කරන්නට සමත් පුරාවස්තු, විෂයානුබද්ධ විඩියෝ දර්ශන, ආකෘති, ශාස්ත්‍රීය පදනමකින් ලිය වී ඇති ප්‍රදර්ශන විස්තර පුවරු සහ ප්‍රතිනිර්මාණිත රාශියක් මෙහිදි ප්‍රදර්ශනය කෙරෙයි.

**සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාර ගොඩනැගිල්ල**
ඓතිහාසික ගාලු කොටුවේ පිහිටි කළු කොටුවත් සූර්ය අට්ටාලයත් අතර මැද පිහිටා ඇති ලන්දේසී පෙරදිග ඉන්දීය වෙළඳ සමාගමෙහි භාණ්ඩ ගබඩාකර තැබීම සඳහා 1676 දි ඉදිකර අවසන් කරන ලද බඩුගබඩා ගොඩනැගිල්ල (පැක් හවුස්) ලෙස ප්‍රකටව ඇති ගොඩනැගිල්ලේ සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරය විවෘතව පවතී. දිගින් අඩි 469 ද පළලින් අඩි ද යුතු මෙම ගොඩනැගිල්ල උසින් අඩි වේ. සාමාන්‍යයෙන් ඝනකමින් වන බිත්ති සහිත මෙම ගොඩනැගිල්ල ඕලන්ද වාස්තුවිද්‍යාත්මක ශෛලීන්ට අනුකූල ඉදිකර ඇති ඉතා සුවිශේෂී ගොඩනැගිල්ලක් වන අතර එහි ප්‍රදර්ශිත පුරාවස්තූන් මෙන්ම ගොඩනැගිල්ල ද ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුක්තය.

**සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාර ලාංඡනය**
උතුරු මැද පළාතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දූවේගල නැමැති ස්ථානයෙහි ඇති ක්‍රි.පූ. 2-1 කාලයට අයත් දූවේගල ශිලාලේඛනය නමින් ප්‍රකට, බරත වංශික සංඝරක්ඛිතගේ ගුහාව යනුවෙන් කෙටුම්පත්කර ඇති ශිලාලේඛනය සමගින් දක්නට ලැබෙන මෙම සංකේතය සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරයේ නිල ලාංඡනයයි. තනි කුඹ ගස සහිත නැව නිරූපිත මෙම සංකේතයෙන් දීර්ඝ කාලීනව අන්තර් සමුද්‍රික සබඳතා ඔස්සේ පවැති බහු සංස්කෘතිකත්වය නිරූපණය කෙරන ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුතු යෝග්‍යතම සංකේතය ලෙස සලකා මෙම සංකේතය කෞතුකාගාරයේ නිල ලාංඡනය වශයෙන් එක්කොට ගෙන ඇත.

**සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාර තොරතුරු මධ්‍යස්ථානය හා එහි සේවාව**
සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරයෙහි ඇතුළුවීමේ දොරටුව හා යාබදව පිහිටි තොරතුරු මධ්‍යස්ථානයෙන් සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරය හා අවශ්‍ය සියලු තොරතුරු ලබා ගැනීමේ ඉඩ ප්‍රස්තාව සලසා ඇත. කෞතුකාගාරය සුවිශේෂී ක්‍රියාකාරකම් පිළිබඳ පහසුකම් සහිත ව නිර්මාණය කර ඇත. කෞතුකාගාර අභ්‍යන්තරය හා ප්‍රදර්ශනය පිළිබඳ පූර්ණ දැනුවත් කිරීම් හා විෂයානුබද්ධ විඩියෝ දර්ශන නැරඹීම හා ආයතනික නෛතික පසුබිමට අදාලව ජාලගත කරන ලද පරිගණක දත්ත පද්ධති මඟින් අවශ්‍යය තොරතුරු ලබා ගැනීම, මාසිකව සිදු කරනු ලබන ශාස්ත්‍රීය දේශන පිළිබඳව තොරතුරු දැන ගැනීම සඳහා ඉඩ ප්‍රස්තාව වෙන් කර ඇත. පාසල් ශිෂ්‍යය කණ්ඩායම් හා වෙනත් විශේෂ වෘත්තීමය කණ්ඩායම් සඳහා නොමිලයේ පවත්වන ශාස්ත්‍රීය දේශන හා අධ්‍යාපනික ක්‍රියාකාරකම් පෙර දැනුම්දීම් වලින් පසු ලබා ගැනීමේ වරප්‍රසාද සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරයේදී ලැබෙන අතර විශේෂ නරඹන්නන් (රෝද පුටු වලින් පැමිණෙන හා ආබාධිත



සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාර ගොඩනැගිල්ල



19 වන සියවසෙහි යුවලක්

පුදුගලයන්) සඳහා සුවිශේෂී පහසුකම් සහිත ප්‍රවේශ මාර්ග හා අවශ්‍යය රෝද පුටු සහ සුහදශීලි සේවාවන් රැසක් ලබා ගැනීමේ අවකාශීය පරිසරයක් මෙහිදි සලසා ඇත.

**සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරයේ ප්‍රදර්ශන මැදිරි**

සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරයේ අභ්‍යන්තර ප්‍රදර්ශන මැදිරි නිර්මාණය කිරීමේ දී පුරාවිද්‍යාත්මක උපදේශක මහාචාර්ය රාජ් සෝමදේව මහතාගේ සංකල්පයට හා සංරචනයන්ට අනුව ශ්‍රී ලංකාව සතු මුහුදු පුරා විද්‍යාව සහ ඉතිහාසය පිළිබඳ යුග ගණනාවක් හා බැඳි චිත්තාකර්ෂණීය දීර්ඝ වෘත්තාන්තය නිරූපණය කරනුවස් ප්‍රදර්ශන මැදිරි හතරක් පෙර සැලසුම් කළ සංකල්පීය දහරාවට අනුකූල වන සේ බෙදනු ලැබ ඇත.

**පළමුවන ප්‍රදර්ශන මැදිරිය**

මුහුදු පුරාවිද්‍යා හැඳින්වීම, අදහස්, නිර්වචනය, ප්‍රසංගය, ඉන්දීය සාගරයේ සම්පූර්ණ යුග, ඓතිහාසික මතකයන්, මුහුදු තරණයේ ඥාන විභාගය, තේමා කොට ගත් පළමුවන ප්‍රදර්ශන මැදිරිය සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරයේ දීර්ඝතම ප්‍රදර්ශන මැදිරියයි. දූපත් ශිෂ්ටාචාරයක් වශයෙන් මුහුදු සම්පත් සමුද්ධරණයෙහි ඓතිහාසිකත්වය පුරාවිද්‍යා ශේෂ මත ප්‍රාග් ඓතිහාසික යුගය තෙක් ගමන් කරනු ඇත. ඒ පිළිබඳව සිදුකරන ලද පුරාවිද්‍යාත්මකවුත් ශාස්ත්‍රීයවුත් අධ්‍යයනයන්හි ප්‍රතිඵල මත ප්‍රතිනිර්මාණය කරන ලද ප්‍රාග්ඓතිහාසික මානව ජනාවාසයක ආකර්ෂණීය කතාන්දරය සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරයේ පළමු ප්‍රදර්ශන මැදිරියට ඇතුළු වන විටම ප්‍රදර්ශනය කෙරෙයි. උක්ත තේමාවට අනුකූලනය වන පරිදි ඓතිහාසික මතකයන් හා මුහුදු ගමන් පිළිබඳ දැනුම සම්බන්ධ තොරතුරු, පුරාවස්තූන් මෙහි ප්‍රදර්ශනය කෙරෙයි.

**සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරයේ නිදහස් අවකාශය**

ගාලු කොටු පවුරෙහි ඓතිහාසිකත්වය පිළිබඳ වැදගත් තොරතුරු රැගත් විෂයානුබද්ධ වීඩියෝදර්ශන තුළින් අධ්‍යාපනික වශයෙන් නව දැනුම් සම්භාරයක් එක්කර ගැනීමට නිදහස් අවකාශයෙහිදී අවස්ථාව ලැබෙනු ඇත.



මහාරාවණා ප්‍රදේශයෙන් හමු වූ විදුරු බෝතල්

**සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරයේ දෙවන ප්‍රදර්ශන මැදිරිය**

ද්‍රව්‍යාත්මක සංස්කෘතිය, සන්නිවේදනය සහ හුවමාරුව පිළිබඳ සාධක යන තේමානුගතව ප්‍රදර්ශනය කෙරෙන පුරාවස්තූන්, අනුරූ, ශාස්ත්‍රීය පදනමක් මත ලියා ඇති විස්තර පුවරුවලින් මෙම ප්‍රදර්ශන මැදිරිය සමන්විත වේ.

ඉන්දීය සාගර ලෝකයේ නොයෙකුත් අපේක්ෂා මත ක්‍රියාකාරකම් හැසිර වූ පිරිස් වැඩි වශයෙන් ම වාණිජ ක්‍රියාකාරකම් විෂයෙහි දැක් වූ කෘතහස්තභාවය නිසාම ඉන්දීය සාගරයෙහි කේන්ද්‍රීය ස්ථානයක පිහිටි ශ්‍රී ලංකාව සමග පැවැත් වූ සන්නිවේදන හා හුවමාරු ක්‍රම මගින් ශේෂිත ද්‍රව්‍යමය සංස්කෘතියක තොරතුරු මේ ඔස්සේ ප්‍රදර්ශනය කෙරෙයි.



සුනාමි ව්‍යසනයේදී ලංකාවට ගසාගෙන ආ දැව බුද්ධ ප්‍රතිමාව

**සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරයේ තෙවන ප්‍රදර්ශන මැදිරිය**

මුහුද සහ ගොඩබිම, ආධිපත්‍යය සහ ප්‍රතිවිරෝධතා, ජීවමාන උරුමය, සමුද්‍රික මානව විද්‍යාවේ දර්ශන පථය මාතෘකාකොට ගත් තෙවන ප්‍රදර්ශන මැදිරියෙහි දිග හැරෙන කතාන්දරය වර්තමාන සමාජයේ ජීවමාන උරුමය හා සබැඳි පුරාවස්තූන් හා ඒ පිළිබඳව ශාස්ත්‍රීයව ලියවුන විස්තර පුවරු වලින් සමන්විතය. දූපතක් වශයෙන් සංස්කෘතික, ආගමික, අධ්‍යාපනික, දේශපාලනික නාලිකා ඔස්සේ මෙරටට ඇදී ආ සංස්කෘතික ක්‍රියාකාරකම්හි ආනුභාවයත්, ප්‍රතිවිරෝධතාත්, ස්වදේශිකත්වය තුළ අනුකූලනය වූ ආකාරයත් පිළිබඳ තොරතුරු අධ්‍යයනයට තෙවන ප්‍රදර්ශන මැදිරියෙන් අවකාශ ලැබෙයි.

**සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරයේ හතරවන ප්‍රදර්ශන මැදිරිය**

හතරවන ප්‍රදර්ශන මැදිරිය හෙවත් ඇවොන්ඩ්ස්ටර් ප්‍රදර්ශන මැදිරියෙහි පර්යේෂණවල නව පර්යන්ත සොයා යාමේ අවකාශය ලැබෙනු ඇත. සාගර ලෝකය තුළ සැඟවගිය යටගියාව අණාවරණය කරමින් දියයට ගවේෂණ හා කැණීම් තුළින් සමුද්‍ර පුරාවිද්‍යාඥයින්ගේ පරිශ්‍රමය මත ගොඩගත් ඉතා සුවිශේෂී පුරාවස්තූන් රැසක් හතරවන ප්‍රදර්ශන මැදිරියේදී නැරඹීමේ හැකියාව ඇත. සාගර පත්ලෙහි සැඟව ගිය සුන්දර ලෝකය අතර සැරිසරමින් විද්‍යාත්මක පසුබිමක්මත අතීතයේ සැඟවුනු යටගියාව අවලෝකනයට සමුද්‍ර පුරාවිද්‍යාඥයින් ක්‍රියාකරන ඇකාරයත් සමුද්‍ර ජීව ලෝකයෙහි ආශ්වාදය විඳින්නටත් ලැබෙන දුර්ලභ අවස්ථාව ලැබෙනුයේ මෙම සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරයෙන්ම පමණි. ඇවොන්ඩ්ස්ටර් (සන්ධ්‍යා තාරකාව) හෙවත් සැඳෑ තරුව, බ්ලෙසින් (ආශීර්වාදය) නමින් හඳුන්වන නෞකාවේ අනුරුව සමගින් එය මුහුදු පත්ලෙහි සැඟව ඇති ආකාරය ප්‍රතිනිර්මාණිත අංගනයක් සමගින් පුරාවස්තූන් රාශියක් ප්‍රදර්ශනය කෙරෙයි.

**සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරයේ වෙළෙඳ කුටි**

මධ්‍යම සංස්කෘතික අරමුදල හා වෙනත් ප්‍රකාශන ආයතන මගින් ප්‍රකාශිත ඉතිහාසය, පුරාවිද්‍යාව, සමුද්‍ර පුරාවිද්‍යාව යන විෂයානුබද්ධව ලියවුනු ශාස්ත්‍රීය කෘති, සඟරා, ළමා කතාන්තර මෙන්ම මධ්‍යම සංස්කෘතික අරමුදල බටලීය අනුරූ නිකේතනයෙන් නිර්මාණය කළ වටිනා අනුරූ, සුභ පැතුම්පත්, සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරයේ ප්‍රකාශන රැසක් මෙම ස්ථානවලින් ලබා ගැනීම සඳහා ඉඩකඩ ලැබේ

**සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරයේ කාර්ය**



ප්‍රාග් ඓතිහාසික ජනයා



ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා කෞතුකාගාරය නරඹමින්

**මණ්ඩලය**
මධ්‍යම සංස්කෘතික අරමුදල ප්‍රධාන කාර්යාලයෙන් පාලනය වන මෙම කෞතුකාගාරයේ පුරාවිද්‍යාව පිළිබඳ විශේෂවේදි හා පශ්චාත් උපාධි අධ්‍යාපනය සහිත කෞතුකාගාර නිලධාරීන් පිරිසක් කෞතුකාගාර පාලක ගාමිණී දොඩම්වල මහතා සමගින් මෙහි සේවයේ යෙදී ඇත. එසේම කෞතුකාගාරයේ කාර්යාලයීය නිලධාරී මහත්ම මහත්මීන්, සමුද්‍ර පුරාවිද්‍යා ඒකකයේ නිලධාරී මහත්ම මහත්මීන්, කෞතුකාගාරයේ අභ්‍යන්තර සේවක මහත්ම මහත්මීන්, කෞතුකාගාරයේ ආරක්ෂක සේවයේ මහත්මයන් සියලුම දෙනා සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරයේ සියලුම


කෞතුකාගාර පාලක ගාමිණී දොඩම්වල මහතා නෙදර්ලන්ත තානාපතිතුමිය දැනුවත් කරමින්

සේවාවන් සමගින් කැපවී ක්‍රියාකරන අතර ඔවුනගේ සුහදශීලි සේවාව අවශ්‍යය ඕනෑම අවස්ථාවක දී ලබා ගත හැකිය. අනාගත පරපුර උදෙසා අතීත උරුමයන් ඉතිරි කර තැබීමට ගන්නා කෘතහස්ත කාර්ය භාරය පැසසීම යුක්තිසහගත වෙනු ඇත.
කෞතුකාගාරය ඉදිකිරීමේ දී ශ්‍රී ලංකා ජනරජයේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා, නෙදර්ලන්ත රජයේ ශ්‍රී ලංකා තානාපතිනි ලියෝනි කුලේනාර මැතිණිය හා තානාපති කාර්යාල නිලධාරී මණ්ඩලය, සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යංශයේ අමාත්‍යය මහින්ද යාපා මහතා හා නියෝජ්‍යය අමාත්‍යය පියසිරි විජේනායක මහතා, සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යංශයේ ලේකම් විමල් රූබසිංහ මහතා, මධ්‍යම සංස්කෘතික අරමුදල අධ්‍යක්ෂ ජනරාල් සුදර්ශන් සෙනවිරත්න මහතා, මහාචාර්ය නිමල් ද සිල්වා මහතා, පුරාවිද්‍යා උපදේශකත්වය දැරූ මහාචාර්ය රාජ් සෝමදේව මහතා, වාස්තු විද්‍යාඥ සාගාර ජයසිංහ මහතා, ප්‍රධාන කාර්යාලයේ සහ මධ්‍යම


මහාචාර්ය රාජ් සෝමදේව මහතා මාසික ශාස්ත්‍රීය දේශනයක් පවත්වමින්

සංස්කෘතික අරමුදලේ සියලුම නිලධාරීන් සහ සේවක පිරිස, සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාර පාලක ගාමිණී දොඩම්වල මහතා ඇතුළු කාර්යාල නිලධාරී මහත්ම මහත්මීන්, සමුද්‍රවිද්‍යා ඒකකයේ නිලධාරීන් සහ සේවක මහත්ම මහත්මීන්, පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සෙනරත් දිසානායක මහතා, කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ආචාර්ය නන්දා වික්‍රමසිංහ මහත්මිය, උපදේශක හේමා ජයවීර මහත්මිය සහ සම්බන්ධිකාරක සි. ඩි. විදානපතිරණ මහතා, විදුලි ඉංජිනේරු රෝහිත සේනාරත්න මහතා, පුරාවිද්‍යාඥ පත්බේරියේ ඥාණාලෝක හිමි, වාස්තු විද්‍යාඥ නිලාන් කුරේ මහතා සහ හේමන්ත බලවන්ද්‍ර මහතා, බටලීය අනුරු නිකේතනයේ නිලධාරීන් හා සේවක මහත්ම මහත්මීන් පේරාදෙණිය, කැලණිය, රුහුණ


පාසල් ශිෂ්‍යය පිරිසක් දැනුවත් කරමින්

විශ්ව විද්‍යාලවල පුරාවිද්‍යාව පිළිබඳ විශේෂවේදි හා පශ්චාත් උපාධිධාරී පර්යේෂණ කණ්ඩායම මගින් ලැබුණු අනුපමේය සේවාව වෙනුවෙන් කෘතඥතාවය හිමි විය යුතුය.

**ස්තුතිය**

- කෞතුකාගාර පාලක ගාමිණී දොඩම්වල මහතාට
- කෞතුකාගාරයේ පුරාවිද්‍යා උපදේශක මහාචාර්ය රාජ් සෝමදේව මහතාට

## ආසියානු උරුමය පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයක්
## The International Association for Asian Heritage - IAAH



කාලීන අවශ්‍යතාවක් පරිපූර්ණ කරමින් ආසියානු උරුමය පිළිබඳ නව ජාත්‍යන්තර සංවිධානයක සමාරම්භය පසුගිය ඔක්තොම්බර් මස 27 වෙනි දින බත්තරමුල්ල, ඉසුරුපායේ දී නියෝජ්‍ය අධ්‍යාපන අමාත්‍ය ටි. බී. ඒකනායක මහතාගේ ප්‍රධානත්වයෙන් කැළණි, ජයවර්ධනපුර, රජරට, යාපන, රුහුණු, පේරාදෙණි යන විශ්වවිද්‍යාල හා පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, archaeology.lk යන ආයතනයන්ගේ සහභාගිත්වයෙන් සටහන් විය. සංගමය නිල වශයෙන් ආරම්භ කිරීම හා සංගමයේ අරමුණු පැහැදිළි කොටගෙන නව නිලධාරී මඩුල්ල පත්කර ගැනීම මෙදින සිදුවිය.

ආසියාවේ සංස්කෘතික හා ස්වභාවික උරුමය පිළිබඳ අධ්‍යයනය කිරීම, ආසියානු උරුමය පිළිබඳ දැනුම බෙදාහැරීම, අධ්‍යයන, ප්‍රතිපත්ති සම්පාදනය, උරුම කළමනාකරණ, උරුම හිමිකරුවන් හා ඒ පිළිබඳ උනන්දුවක් දක්වන්නන් සඳහා මගපෙන්වීම, සිසුන් හා උරුම ආරක්ෂකයින් සඳහා අනුග්‍රහය දැක්වීම ආදී අරමුණු රැසක් මුල්කරගනිමින් මෙම සංවිධානය ක්‍රියාත්මක වීමට නියමිතය.

නියෝජ්‍ය අධ්‍යාපන අමාත්‍ය ටි. බී. ඒකනායක මහතාගේ සභාපතීත්වයෙන් යුතු මෙම සංගමයේ මහලේකම් තනතුර මහාචාර්ය අනුර මනතුංග මහතා විසින් දරනු ලැබේ. මහාචාර්ය ඒ. ඒ. ඩී. අමරසේකර මහතා භාණ්ඩාගාරික පදවිය හොබවයි. විධායක කමිටුවකින් මෙන්ම ස්ථාවර කමිටු 7ක් මගින් මෙම සංගමයේ කාර්යයන් දියත් වීමට නියමිතය. පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සෙනරත් දිසානායක, ජාතික කෞතුකාගාරයේ අධ්‍යක්ෂිකා ආචාර්ය නන්දා වික්‍රමසිංහ, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ මහාචාර්ය ජගත් වීරසිංහ යන මහත්මමහත්මීන් ප්‍රමුඛ විද්වතුන් 16 දෙනෙකු විධායක කමිටුව නියෝජනය කරයි.

ක්‍රියාත්මක ස්ථාවර කමිටු පහත පරිදිය.
1 අධ්‍යාපන කමිටුව
(සභාපති : මහාචාර්ය වසන්ත් සින්ද්, ඩෙකෑන් විද්‍යාලය.)
2 ක්ෂේත්‍ර අධ්‍යයන කමිටුව
(සභාපති : ආචාර්ය සෙනරත් දිසානායක, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව)
3 අරමුදල් ප්‍රවර්ධන කමිටුව
(සභාපති : ජනක මල්ලිමාරච්චි මහතා, තැපැල් හා සන්නිවේදන අමාත්‍යාංශය)
4 ප්‍රකාශන හා පුස්තකාල කමිටුව
(සභාපති : ආචාර්ය මැරිස් මොලෙන්, ලුන්ඩ් විශ්වවිද්‍යාලය, ස්වීඩනය)
5 සාමාජිකත්ව කමිටුව
(සභාපති : ආචාර්ය ඩී. කේ. ජයරත්න, පේරාදෙණි විශ්වවිද්‍යාලය)
6 සම්මේලන කමිටුව
(සභාපති : රාබි මොහන්ති, ඩෙකෑන් විද්‍යාලය, පූනේ)
7 මාධ්‍ය හා මහජන සම්බන්ධතා කමිටුව
(සභාපති : ආචාර්ය නන්දා වික්‍රමසිංහ, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව)




පුරාවිද්‍යාව හැදෑරුව අය විදිහට සමහර වෙලාවට අපේ වගකීම මොකක්ද කියලා අපි දන්නෑ. එතකොට අපට වගකියන කෙනෙකුත් නෑ, අපිව බලාගන්න කෙනෙකුත් නෑ. එතකොට වෙන්නේ අපි අයාලේ යනවා. එහෙම අයාලේ ගියාම **පුරාවිද්‍යාවත් ඉවරයි, අපිත් ඉවරයි, අපේ දැනුමත් ඉවරයි, රටත් ඉවරයි.**

# මහාචාර්ය ආරිය ලගමුව

පීඨාධිපති, සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය,
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ.

---

සංවාද සටහන හා ඡායාරූප

චන්දිම අඹන්වල, මහින්ද කරුණාරත්න

**ඔබතුමා පුරාවිද්‍යා මහාචාර්යවරයෙක් දක්වා පැමිණි ගමන පිළිබඳ කෙටියෙන් විස්තර කළොත්**

මම මහනුවර දිස්ත්‍රික්කයේ කඩුගන්නාව, ලගමුව කියන ගමේ පුද්ගලයෙක්. 1960 මම උපන්නේ. අපි අධ්‍යාපනය ලැබූ කාලය අධ්‍යාපනය ලැබීම දුෂ්කර කාලයක්. මම මුලින්ම ගමේ පාසලින් මූලික අධ්‍යාපනය ලබල පසුව නුවර පාසලකට ඇතුළු වෙලා ද්විතීය අධ්‍යාපනය ලබල විශ්වවිද්‍යාලයට ඇතුළු වුනා. ඒ කාලේ විශ්වවිද්‍යාල වල විද්‍යාර්ථීන් අතර වුනත් ඉල්ලුමක්, ආශාවක් තිබුනේ ආර්ථික වශයෙන් හැකියාවක් ඇති ආර්ථික වශයෙන් වාසි ලැබිය හැකි විෂයන් හැදෑරීමට තමයි. අපිට ගමෙන් ලැබුණු ආභාසය නිසාද දන්නේ නැහැ අපේකම, අපේ දේවල් ගැන, ඉතිහාසය, පුරාවිද්‍යාව, උරුමය ගැන හොයන්න ආශාවක් මට තිබුණා. ඒ නිසා මම පුරාවිද්‍යා විෂය හැදෑරීමට ගියා. මම විශ්වවිද්‍යාලයෙන් පිට වුණු 1985 ඉඳල විවිධ ක්ෂේත්‍රවල කටයුතු කළා. ඒ වසරේ මම මධ්‍යම සංස්කෘතික අරමුදලට බැඳුණා. මුලින් මහනුවර වැඩ කළා. එයින් පස්සේ පොළොන්නරුවේ වැඩ කළා. එයින් පසුව අභයගිරියේ කළක් සේවය කළා. එයින් පසුව මට ශ්‍රී ලංකා ජාතික පුස්තකාල මණ්ඩලයට ඇතුළු වීමට අවස්ථාවක් ලැබුණා. ටික කාලයක් යද්දි මට උතුරුමැද පළාතේ අනුබද්ධ විශ්වවිද්‍යාල විද්‍යායතනයට කථිකාචාර්ය වරයෙක් ලෙස බැඳීමට අවස්ථාව ලැබුණා. ඇත්තටම මට ආශාවකුත් තිබුණා විශ්වවිද්‍යාලයක ආචාර්යවරයෙක් වීමට අවස්ථාවක් තියෙනවනම් හොඳයි කියල. ඒ අවස්ථාවෙන් මම ප්‍රයෝජන ගත්තා. ඒ අනුව එම ආයතනයට බැඳුණා. 1996 ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය ආරම්භ කළා. ඒ ආරම්භ කිරීමේ දී ඒ හිටපු ආචාර්යවරුන් විශ්වවිද්‍යාලයට අනුයුක්ත කළා. ඒ අනුයුක්ත කරනකොටත් මම ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙක් ලෙසයි වැඩ කළේ. එතන ඉඳල මම මගේ කටයුතු කරගෙන ගියා. විවිධ අවස්ථාවල පරිපාලන ක්ෂේත්‍රයේ වැඩත් කළා. අධ්‍යයන අංශාධිපතිවරයෙක් වශයෙන් ඒ වගේම නේවාසිකාගාර පාලකයෙක් හැටියට. වෙනත් විවිධ තනතුරුත් දැරුවා. ඒ වගේම මගේ පර්යේෂණ කටයුතුත් දිගටම කරගෙන ගියා. ඒ වගේම පොතපත පුළුවන් තරම් ලිවුව. ඇත්තෙන් ම විවේකයක් කියල දෙයක් ගත කරන්න මම උත්සාහ කළේ නැහැ. විවිධ විනෝදාංශ තිබුණත් මම ඒවට ඇබ්බැහි වුනේ නැහැ. එහෙම ගිහිල්ල මම කරපු උත්සාහයේ, දරපු ප්‍රයත්නයේ ප්‍රතිඵල මට 2006 වන කොට නෙළාගන්න පුළුවන් වුණා. ඒ කියන්නේ මට ඒ වෙනකොට පූර්ණ මහාචාර්ය තනතුරට ලගාවෙන්න පුළුවන් වුණා. ඒ ගැන මම බොහොම සතුටු වෙනවා. ග්‍රාමීය පරිසරයකින් ඇවිල්ල; ඒ වගේම බොහෝ දෙනාගේ සිත් ඇඳබැඳ නොගන්නා; ආර්ථික වශයෙන් වාසියක් නැති විෂයක් හදාරලා මට එන්න පුළුවන් උපරිම තැනට මම ආවා. විවිධ දුෂ්කරතා තිබුණා, විවිධ බාධක තිබුණා. ඒවා

පවත්නා සමාජ අවශ්‍යතා හා වුවමනාවන් වෙත සංවේදී වෙමින් පර්යේෂණ හා අධ්‍යන කටයුතු සිදුකිරීම සංවේදී බුද්ධිමතෙකුගේ යුතුකම මෙන්ම වගකීමයි. අධ්‍යතන සමාජයේ විද්වතුන් වශයෙන් පෙනීසිටින බොහෝ දෙනෙකු විවිධ හේතුසාධක දක්වමින් මෙම සමාජ වගකීමෙන් පළාගොස් ඇති බව දක්නට ඇති කරුණකි. මෙවන් පසුබිමක් තුළ තමා වෙත පැවරී ඇති සමාජ වගකීම හා යුතුකම් මනාලෙස අවබෝධ කරගනිමින් කටයුතු කරන නිහඬ විද්වතෙක් ලෙස මහාචාර්ය ආරිය ලගමුව මහතා හඳුනාගත හැකි ය.

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා අධ්‍යාපනයේ පුරෝගාමියා වන එතුමා එහි පළමු මහාචාර්යවරයා මෙන්ම වර්තමාන සාමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨයේ පීඨාධිපතිවරයා වශයෙන් ද කටයුතු කරයි. පුස්කොළ ලේඛන කලාව පිළිබඳ ප්‍රශස්ත අධ්‍යයනයක් සිදුකර ඇති එතුමා ඊට පරිබාහිරව අභිලේඛන විද්‍යාව, වාස්තුවිද්‍යාව, බුදුපිළිමය, ඓතිහාසික රාජධානි ආදී ක්ෂේත්‍ර ගණනාවක් පිළිබඳව පර්යේෂණ සිදුකර පොත්පත් රැසක් ප්‍රකාශයට පත් කළ රාජ්‍ය සම්මාණයෙන් පිදුම් ලද විද්වතෙකි. ජාතික හා ජාත්‍යන්තර තලයේ සඟරා සඳහා පර්යේෂණ ලිපි රැසක් ද සම්පාදනය කර ඇති මහාචාර්ය ලගමුව, ඉදිරියේදීත් එවැනි පර්යේෂණ ප්‍රමුඛ කාර්යයන් සඳහා කැපවෙමින් සිටී.

1980 දශකයේ සිට විවිධ ආයතනයන්හි සේවය කොට අද්දැකීම් රැසක් ලබා ඇති එතුමා සමඟ ***දිනිති ~ ශ්‍රී ලංකා පුරාවිද්‍යාව*** විද්‍යුත් සඟරාව පැවැත් වූ සංවාදය මේ සමඟ පළ වෙයි.
ශ්‍රී ලංකා පුරාවිද්‍යා හා ජාතික උරුම ක්ෂේත්‍රය පිළිබඳ වැදගත් කරුණු රැසක් පිළිබඳව පාඨක මනස යොමුකිරීමට මෙම කරුණු පදනම් වනු ඇත.



ඉතිං හිතේ ධෛර්යය සහ කැපවීම නිසා ජයගන්න පුළුවන් වුණා. ඒ නිසා මට සතුටු වෙන්න පුළුවන්. ඒ විතරක් නෙවෙයි 2006 සිට රජරට විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨයේ පීඨාධිපතිවරයා වශයෙනුත් මේ දක්වා කටයුතු කරනවා. ඒ අතින් මම බොහොම සන්තෝස වෙනවා.

**ඔබතුමාට හමු වූ ගුරුවරුන් ගැන සිහිපත් කළොත් ?**

මට මතක විදිහට පාසල් වියේ දී මට විවිධ ප්‍රශ්න තිබුණා. අධ්‍යාපනය ලැබීමට මම දක්ෂයෙක් නෙවෙයි කියන අදහස මගේ මුල්ම පාසලේ පංතිභාර ගුරුතුමා තුළ තිබුණා. ඒ නිසා මම පාසල මඟහැරල ගිය අවස්ථාත් තියෙනවා. ඒ කියන්නේ කැළා පනිනවා කියන්නේ. ශිෂ්‍යන්ගේ අදහස් උදහස් සමහර ගතිපැවතුම් තේරුම් ගන්න බැරි සමහර ආචාර්යවරුන් එකල හිටියා. නමුත් පසු කාලය වන විට මම උත්සාහ කරල මගේ අඩුපාඩු තිබුණානම් ඒවා නිවැරදි කරගෙන අධ්‍යාපනයට අවතීර්ණ වුණා. ඒ නිසා ඉදිරියට ආවා.
විශ්වවිද්‍යාලය කියන්නෙ කඩයිමක්නේ අපේ. මම විශ්වවිද්‍යාලයට ආවට පස්සෙ මට මුලින්ම හමු වුණේ එවකට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා අධ්‍යයන අංශයේ අංශාධිපතිවරයා වශයෙන් කටයුතු කළ මහාචාර්ය පී. එල්. ප්‍රේමතිලක මැතිතුමා. එතුමා මගේ මුල්ම ගුරුවරයා. ඉන් පස්සේ ආචාර්ය ඩබ්. එච්. විජයපාල මැතිතුමා. එයින් පස්සේ මහාචාර්ය සුදර්ශන් සෙනෙවිරත්න මැතිතුමා. තව හිටියා ජයතිලක කියල මහත්මයෙක් එතුමා. මේ අය පුරාවිද්‍යාව සම්බන්ධයෙන් මම හුගක් ආභාසය ලබපු උතුමන්ලා.
බාහිර වශයෙන් ගන්නවනම් ආචාර්ය සිරාන් දැරණියගලයන්. ඒවගේම මහාචාර්යවරයෙක් හිටිය සිංහල අධ්‍යයන අංශයේ සෙල්ලිපි සම්බන්ධයෙන් නම ගිය පී. ඊ. ඊ. ප්‍රනාන්දු කියල. මම යද්දි නම් එතුමා විශ්‍රාම ගිහින් හිටියේ. එතුමා මගේ හැකියාවන් දැනගෙන සෙල්ලිපි අංශයෙන් ඉදිරියට යන්න කියල මට උපදෙස් දුන්නා. ඒකත් මම අවධාරණය කරගත්තා. ඒ අංශයෙන් වගේම මට පුළුවන් විවිධ අංශවලින් මට පුළුවන් දේ මම කරනවා. ඉන් පස්සේ සිංහල අධ්‍යයන අංශයේ මහාචාර්ය කේ. එන්. ඕ. ධර්මදාස මැතිතුමා, ඒ වගේම පුරාවිද්‍යා කොමසාරිස්ව සිටි ආචාර්ය රෝලන්ඩ් සිල්වා, මොරටුව විශ්වවිද්‍යාලයේ මහාචාර්ය නිමල් ද සිල්වා, කැළණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය සේනක බණ්ඩාරනායක මැතිතුමා යන අයත් මම ඇසුරු කළ මට උපදෙස් දුන්නු මාව නිසි මඟට යොමු කළ ආචාර්යවරුන් ලෙස මම අදත් ඉතාම ගෞරවයෙන් සිහිපත් කරනවා.

**ඔබතුමාගේ පර්යේෂණ හා ප්‍රකාශන පිළිබඳ ව ඔබතුමා ම විස්තර කළොත් ?**

පුරාවිද්‍යාව කිව්වහම බහු විෂයික විෂයක්නේ. ඒ නිසා විවිධ ක්ෂේත්‍ර තියෙනවා. ඒ එක එක ක්ෂේත්‍රවල විවිධ විද්වතුන් ප්‍රවීනත්වයට පත් වෙනවා. ඇත්තට ම මම එකම ක්ෂේත්‍රයක් බදාගෙන හිටියේ නැහැ. හැමවෙලාවෙම විවිධත්වයක් ඇතිව පුරාවිද්‍යා ක්ෂේත්‍රයට අයත් විවිධ අංශවල මම මට පුළුවන් විදිහට පර්යේෂණ කළා. හැමවෙලේම මම බැලුවේ නොකෙරෙන දෙයක් කරන්නයි. අලුත් දෙයක් තියෙනවනම් ඒ දෙය කරන්නයි. මට හිතුන එකක් තමයි භික්ෂූන් වහන්සේලාගේ උපෝසථඝරය ගැන හොයන්න ඕන කියල. මේ ගැන කවුරුත් ගැඹුරින් පර්යේෂණ කරල නැහැ. නමුත් ලංකාවේ රාජ්‍ය ආගම බුද්ධාගම. බුද්ධශාසනයේ පැවැත්ම උපෝසථඝරය. මේ ගැන අධ්‍යයනය කරන් නැත්තේ ඇයි කියල හිතල මම මේ ගැන අධ්‍යයනයක් කළා. මෙය වාස්තුවිද්‍යාව පදනම් වූ අධ්‍යයනයක්. ඊට පස්සේ මගේ අවධානය යොමු වුනේ බෞද්ධ ප්‍රතිමාවල ප්‍රතිමා ලක්ෂණ පිළිබඳ අධ්‍යයනය කරන්න. බුදුපිළිමය ගැන හැමෝම අධ්‍යයනය කරනවා, නමුත් ඒවායේ ප්‍රතිමා ලක්ෂණ ගැන ශාස්ත්‍රීය මට්ටමේ අධ්‍යයනය කරල තියෙන්නෙ ඉතාම අඩුවෙන්. ඊට පස්සේ පොළොන්නරුව ගැන පොතක් ලිව්වා. සංචාරක කර්මාන්තය, අපේ උරුමය, පුරාවිද්‍යාව, ඉතිහාසය ගැන අපේ දේශීය සංචාරකයන්ට අවබෝධයක් දීමටයි මේ පොත රචනා කළේ. මේ වනවිට මේ සම්බන්ධයෙන් අත්පත්‍රිකාවක්වත් හොයා ගැනීම අපහසු කාලයක්. ඒ නිසා නිකන් ගිහින් වැඳල බලල එනවට වඩා යම් දැනුමක් ඇතිව මේවා බලන්න, අධ්‍යයනය කරන්න අවස්ථාවක් ඇති කිරීම තමයි මේකේ අරමුණ වුනේ. පස්සේ පුස්කොළ පොත් ගැන අධ්‍යයනය කළා. මේක අතහැර දමන ලද එකක්නේ. මේක ඉතා වැදගත් එකක්. නමුත් දැන් ඒක නැති වේගෙන යන්නේ. මේව ගැන දැන් ලියන අය නැහැ. කලාතුරකින් ස්වාමීන් වහන්සේලා නමක්, දෙනමක් මේව ලියනවා. ඒ වගේම වයෝවෘද්ධ වෙද මහත්වරු වගේ අය කීපදෙනෙක් ඉන්නවා. කේන්ද්‍ර ලියන එකත් අද නෑනේ. ඒකත් කොම්පියුටරයෙන් කරන්නේ. පුරාවිද්‍යාඥයෝ, ඉතිහාසඥයෝ තමයි මේගැන හොයල බලල ආරක්ෂා කරන්න, සංරක්ෂණය කරන්න පියවර ගන්න ඕනේ. මේක විනාශ වෙලා යන එකක් නිසා අනාගතයේ මෙහෙම දෙයක් තිබුණා කියල හෝ දැනගැනීමට පිළිවෙලක් කරනවනම් හොඳයි කියල මට හිතුනා. ඒ නිසා මම ඒ ගැන අධ්‍යයනය කිරීමට උත්සාහ කළා. ඒ අනුව මට විවිධ ක්ෂේත්‍රවල යම්යම් දේවල් කිරීමට හැකි වුණා. ඒවා අමුතුම වැඩ. එහෙම නැත්නම් අලුත්ම දේවල් හැටියට මගේම දෙයක් කිරීම. පුරාවිද්‍යාවේ විවිධ විද්‍යාත්මක දේවල් ගැනත් මම කතාකළා. වැරදි අඩුපාඩු තියෙනවා නම් ඒ ගැනත්, හොඳ තියෙනවා නම් ඒ ගැනත් මම කතා කළා. පර්යේෂණයක් කියන්නේ මේ දෙයනේ. විශේෂයෙන්ම පුරාවිද්‍යාවේ ප්‍රධාන අංශය වන ගවේෂණ, කැනීම් හා සංරක්ෂණ වැනි ක්ෂේත්‍රයේ කරන පර්යේෂණ ගැන පාසැල් හෝ විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ටත් සාමාන්‍ය ජනතාවටත් දැනගන්න, ඉගන ගන්න සිංහලෙන් හොඳ පොතක් තිබුණෙ නෑ. ඒ සඳහා මම 1996 ගවේෂණයක් කරල ලිව්ව ''ප්‍රායෝගික ක්ෂේත්‍ර පුරාවිද්‍යාව'' කියල පොතක්. ඒක ශිෂ්‍යයන්ට ඉතාම ප්‍රයෝජනවත් උනා. මට හරිම සතුටුයි ඒ ගැන.
මෑත දී මම මිහින්තලේ සෙල්ලිපි ගැන ලිව්වා. මේ ගැන පැහැදිලි එකතුවක් නැහැ. විවරණයක් නෑ. ඒ නිසා මිනිස්සු ඒ ගැන දන්නෙ නැහැ. තැනින් තැන යම් යම් විස්තර තියෙනවා. මිහින්තලේ 4 මිහිඳු රජුගේ පුවරු ලිපිය තියෙනවා. ඉතිං නිකන් පුවරු ලිපියක් තියෙනවා, නිකං ගිහිං බලල නිකම්ම යනවා. නමුත් මේකේ මොනවද තියෙන්නේ, කවදද ලියල තියෙන්නේ, කවුද ලිව්වේ කියන ඒව ගැන අදහසක් නැහැ. ඒ ගැන අදහසක් දීපුවහ ම මිනිස්සුන්ට ඒ ගැන අවබෝධයක් ගෞරවයක් ඇති වෙනවා. තමන්ගේ උරුමය ගැන අවබෝධයක් ඇති වෙනවා. එතකොට ඒවාට හානි කරන එක අඩු වෙනවා. ඒ නිසා මිහින්තලේ සෙල්ලිපි කියන පොතේ මම මිහින්තලේ සෙල්ලිපි සියල්ල අර්ථ වර්ණනා සහිත ව විස්තර කරල ලියල තියෙනවා. ඊට පස්සේ මම මිහින්තලේ කැටයම් බිතුසිතුවම් හා මූර්ති ගැන අවධානය යොමු කරල පොතක් ලිව්වා. ඒ ගැනත් හරියට










මහාචාර්ය ආරිය ලගමුව මහතා විසින් රචනා කරන ලද ග්‍රන්ථ කීපයක්



මිහින්තලේ මහා සෑය

පර්යේෂණයක් කෙරිල නැහැ. කැටයම් ගැන මහාචාර්ය පරණවිතාන වැනි කීප දෙනෙක් කරල තියෙනවා. නමුත් වෙන වෙන ම මේ ගැන අධ්‍යයනය කරල නැහැ. මිහින්තලේ කියන්නේ අපේ ශිෂ්ටාචාරයේ, සංස්කෘතියේ තොටිල්ලනේ. සංස්කෘතියේ මුල් බිම. ඒ නිසා මේකෙන් තමා අපි පටන් ගන්න ඕනේ. මේකෙන් තමා හැමදෙයක්ම ලෝකෙට, රටට ගියේ. ඒ නිසා මිහින්තලේ ගැන හොඳ අවබෝධයක් මහජනයා තුළ තියෙන්න ඕනේ. ඇත්තටම මිහින්තලේ මතක් වෙන්නේ මිහිඳු හාමුදුරුවෝ ගැන කතාකරන පොසොන් පෝයට විතරයි. එහෙම නැත්නම් අනුරාධපුරයට වන්දනා කිරීමට හෝ සංචාරය කිරීමට එන බොහෝ දෙනා එහෙන් සංචාරය අවසන් කරල; යනව. මිහින්තලයට එන් නෑ. ඇයි මිහින්තලේ ගැන තියෙන අවබෝධය අඩුයි. මිහිඳු හාමුදුරුවෝ වැඩියා යැයි කියන අදහස පමණයි ජනයා අතර තහවුරු වෙලා තියෙන්නේ. නමුත් මෙතන තියෙන පුරාවිද්‍යාත්මක, ඓතිහාසික, ආගමික වටිනාකම ගැන මිනිසුන්ට හොඳ අවබෝධයක් නැහැ. ඒ නිසා මම ඒ දේවල් ගැන හොයන්න පුළුවන් දේවල් හොයල ඒ පොත ලිව්ව. මේ වගේ පර්යේෂණ තමා මම කරල තියෙන්නේ. දැනට මම පොත් දහයක් දොළහක් පමණ ලියල තියෙනවා. ජාත්‍යන්තර හා ජාතික මට්ටමින් ප්‍රකාශයට පත් වූ ලිපි 75ක් පමණ ලියල තියෙනවා. ඉදිරියටත් මම ඒ වගේ වැඩ කරගෙන යනවා. අධ්‍යයන කටයුතු, පර්යේෂණ කටයුතු, සමාජයට දැනුම බෙදා හැරීමේ කටයුතු මෙන්ම විශ්වවිද්‍යාලයේ පරිපාලනය හා සම්බන්ධ කටයුතු තමයි මම කරගෙන යන්නේ.
32.00

**පර්යේෂණ කිරීමේදී සම්පත් හා කාලය අඩුයි කියන අයට දෙන පිළිතුර කුමක් ද?**

මට හිතෙන්නෙ මේක හිතළුවක් කියල. වගකීමෙන් බේරෙන්න කෙනෙකුට කියන්න පුළුවන් හොඳම දේ තමයි වෙලාවක් නෑ කියන එක. නමුත් මම කල්පනා කළේ වෙනත් විදිහකට. මධ්‍යම සංස්කෘතික අරමුදලේ සංස්කෘතික ත්‍රිකෝණයට ඇතුළු වෙනකොට ඒක 1985 ආරම්භ කළා විතරයි. අපි ඉන්න වාඩිය පවා හදාගෙන තමයි අපිට ඒක ආරම්භ කරන්න වුනේ. අපි ගියේ පර්යේෂණ නිලධාරින් වශයෙන්. ඒත් කම්කරුවාගේ ඉඳල සමහර විට මහාචාර්යවරයා කරන වැඩත් අපිට කරන්න සිද්ධ වුනා. පරිපාලන කටයුතු, නඩත්තු කටයුතු ආදී සියල්ල අපිට කරන්න වුනේ. සමහර විට අතුපතු ගාන්නත් සිද්ධ වුනා. ඒක එහෙමයි. නමුත් අපි මොන වැඩක්වත් අතපසු කළේ නැහැ. ඊට පස්සේ මම පුස්තකාල සේවා මණ්ඩලයට ඇතුළු වුනේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ආරම්භ කරන්න මාස තුනකට කලින්. ජාතික පුස්තකාලය ආරම්භ කළේ 1992 අප්‍රේල් මාසයේ. 1992 ජනවාරි මාසයේ තමයි අපි එයට සම්බන්ධ වුනේ. අපි ගත්තෙම ජාතික පුස්තකාලය ආරම්භ කරන්න. එතන විශාල වැඩකොටසක් තිබුණා. ඒ විශාල වැඩ කොටසේ තනතුරට අදාළ වැඩ විතරක් නෙවේ වෙනත් වැඩත් තිබුණා. ජාතික පුස්තකාලය නිර්මාණය කිරීමේ



ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

වගකීම අපිට සම්පූර්ණයෙන් ම තිබුණා. ඒ වගකීම සම්පූර්ණ කිරීමට මට හැකි වුණා. මෙතනදී මම මාත් සමග සමීප ව සිටි ජැක්සන් ඇන්තනී සමග එකතු වෙලා ලෝකයේ ලේඛන කලාව ගැන කෞතුකාගාරයකුත් නිර්මාණය කළා. ඒක අදත් තියෙනවා. ඒ අනුව අපි රාජකාරියට අදාළ නොවන දේවලුත් කළා. යම් ආයතනයක ආරම්භක අවස්ථාව කියන්නේ අධික වැඩ තියෙන අවස්ථාවක් නේ. ඒවා කියල අපි රාජකාරී කටයුතු අමතක කළෙත් නෑ. බාහිර කටයුතු අමතක කළෙත් නෑ. ඔක්කොම වැඩ කළා. ඊට පස්සේ මම අනුබද්ධ විශ්වවිද්‍යාලයට ආවනේ. ඒක ආරම්භ කළේ 1992. උතුරුමැද පළාතේ අනුබද්ධ විශ්වවිද්‍යාලය ආරම්භ කළේ අනුරාධපුරේ පුලියන්කුලමේ තිබුණ පරණ වී ගබඩාවක. එතන දී මට අධ්‍යයන, පර්යෙෂණ වැඩ විතරක් නෙවේ පරිපාලන වැඩ කිරීමටත් සිදු වුනා. අංශ ප්‍රධානියෙක් විදිහට වැඩ කරන්න සිද්ධ වුනා. ඉන් පස්සේ නඩත්තු කටයුතු ආදී බාහිර දේවල් කරන්නත් සිදු වුණා. ආරම්භක කාලයේ සේවකයන්, නිලධාරින් ප්‍රමාණවත් තරමට හිටියේ නැහැ. ඔවුන්ගේ වැඩකටයුතුත් අපිට කරන්න සිදු වුණා. ඒත් එක්කම අපි අධ්‍යයන පර්යේෂණ කටයුතු අමතක කළේ නැහැ. ඒක අපි කොහොමත් කළා. ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය ආරම්භ වුනේ 1996දී පරණ ගම්උදා භූමියක. ඒ වෙද්දී මේක කැලයක් වෙලා තිබුණේ. අපි එම වසරේම මේකට සම්බන්ධ වුනා. ඒ හැම එකකින් ම සිදු වුනේ අපිට පන්නරය හොඳට ලැබුණ එක. එව නොකළ නම්, ඒ අවස්ථා අපිට නොලැබුණා නම් අපිත් සමහර වෙලාවට රැකියාව විතරක් කරගෙන, එදිනෙදා කාලය ගතකරගෙන, කාලබීල ඔහේ ඉන්න එක තමා කරන්නේ. මගේ වයසට වඩා මම වැඩ කරල තියෙනවා කියල මට හිතෙනවා. ආයතන කීපයක ම ආරම්භක අවස්ථාවල ඉන්න ලැබීමත් දුර්ලභ අවස්ථාවක්.

එතකොට වේලාවක් නෑ කියන කොට අපිට කිසිම දෙයක් කරන්න බැහැ. අපි කොහොම හරි නිදාගන්න, කන්න, බොන්න වෙලාව හොයා ගන්නවනේ. මොනවහරි විනෝදයක් තියෙනවනම් ඒකටත් වෙලාවක් හොයා ගන්නවනේ. ඉතිං ඇයි මේ ශාස්ත්‍රීය කටයුත්තකට වෙලාවක් හොයාගන්න බැරි. දැනුම ජනතාවට දෙන්න වෙලාවක් හොයා ගන්න බැරි. විශ්වවිද්‍යාල ආචාර්යවරයෙක් හැටියට අපේ වගකීම, වගේම යුතුකම ඒක. සරසවි ආචාර්යවරයා උගන්වන එක නෙවෙයි මූලික කාර්යය පර්යේෂණ කිරීම. උගන්නනවා කියන්නෙත් අපේ අලුත් දැනුමක් ළමයින්ට දෙනව කියන එක. පරණ සටහන් දෙන එක නෙවෙයි. අලුත් දෙයක් හොයාගෙන අපි ළමයින්ට දෙන්න ඕනේ. ලෝකේ මොහොතක් මොහොතක් ගානේ අලුත් වෙනවනේ. අපි අලුත් වෙන්නේ කොහොමද? පර්යේෂණ මගින්. පර්යේෂණ කළේ නැත්නම් අලුත් වෙන්න බැහැ. අලුත් වෙන්න බැරිනම් නියම ගුරුවරයෙක් වෙන්නම බැහැ. ආචාර්යවරයාගේ දැනුම කල් පැනල නම් අලුත් වෙලා නැත්නම් ඔහුගෙන් ඉගෙන ගන්නා ශිෂ්‍යයා තවත් මොට වෙනවා. වෙලාව නෑ කියන්නේ බොරු. ඒ කියන්නේ කැපවීමක් නෑ, ධෛර්යයක් නෑ, ඕනෙකමක් නෑ. ආකල්පවල ලොකු පසුබෑමක් තියෙනවා. ඒකයි මේ කතාවෙන් කියන්නේ.

**පුස්කොළ පොත් උරුමය ලාංකේය උරුමය තුළ ස්ථානගත කරන්නේ කොහොමද?**

මේක අපේ ලේඛන කලාවේ ප්‍රධානම කොටසක්, අංගයක්. නමුත් අපි හැදෑරුවේ සෙල්ලිපි. අපි ඉතිහාසය, පුරාවිද්‍යාව, අතීතය දැනගන්ට; උරුමය දැනගන්න ඕනේ කියන හැමදෙනාම යොමු වුනේ; යොමු කළේ සෙල්ලිපිවලටට. නමුත් සෙල්ලිපිවලට වැඩිය දිග ඉතිහාසයක් ලේඛනය සම්බන්ධයෙන් පුස්කොළවලට තියෙනවා. දැන් අපේ සෙල්ලිපි ආරම්භ කළේ අපි දන්න තරමට; කියන තරමට ක්‍රිස්තු පූර්ව 3 වන ශතවර්ෂයේ නේ. ඊට කලින් තමයි පුස්කොළ පොත් පාවිච්චි වෙලා තියෙන්නේ. දැන් මහාවංශයේ එහෙම ඒ පිළිබඳ තොරතුරු තියෙනවා. ක්‍රිස්තු පූර්ව 6 වන ශතවර්ෂයේ පුස්කොළ කියලම නැති වුනත් ලේඛන කලාව පිළිබඳ තොරතුරු තියෙනවා. ලිපිලේඛන හුවමාරු කළ ඒවා ගැන විස්තර තියෙනවා. අපි දන්නවා ගලේ අකුරු ලියන්න කලින් වෙන මොකක හරි අකුරු ලියන්න එපැයැ. ගල්වඩුවාට මේක තේරෙන්

**වේලාවක් නෑ කියන කොට අපිට කිසිම දෙයක් කරන්න බැහැ. අපි කොහොම හරි නිදාගන්න, කන්නබොන්න වෙලාව හොයා ගන්නවනේ. මොනවහරි විනෝදයක් තියෙනවනම් ඒකටත් වෙලාවක් හොයා ගන්නවනේ. ඉතිං ඇයි මේ ශාස්ත්‍රීය කටයුත්තකට වෙලාවක් හොයාගන්න බැරි. දැනුම ජනතාවට දෙන්න වෙලාවක් හොයා ගන්න බැරි. විශ්වවිද්‍යාල ආචාර්යවරයෙක් හැටියට අපේ වගකීම වගේම යුතුකම ඒක.**

නෑනේ මොනවද තියෙන්නේ කියල. ඒක කවුරු හරි ලියන්න, කියවන්න පුළුවන් කෙනෙක් ලියල දෙන්න ඕනේ. වෙන කෙනෙක් ලියල දෙන එක තමා ගල්වඩුවා ලියන්නේ. එතකොට පුස්කොළ ලේඛන කලාව සෙල්ලිපිවලට කලින් ආපු උරුමයක්. ඒ නිසා ඒ උරුමය ඉස්සෙල්ල ම හොයන්න ඕනේ. දැන් මිහිඳු මහරහතන් වහන්සේ ත්‍රිපිටක හෙළ අටුවාව සංඝායනා කළා කියනවනේ. එතකොට ඒක රචනා කරල තිබුනේ ගල්වල නෙවෙයිනේ. එහෙමනම් පුස්කොළවල විය යුතුයි. ඒත් පුස්කොළ ඓන්ද්‍රිය ද්‍රව්‍යයක් නිසා ඒක විනාශ වෙලා යනවා. ඒ නිසා ඒක අමතක වෙනවා. එතකොට ඇත්තටම පුස්කොළ වඩා පරණයි. දැන් මහාවංශය වුනත් රචනා කළේ ගල්වල නෙවෙයිනේ. ඒ වාගේ හැම දෙයම ලිවුවේ පුස්කොළ පොත් වල.

ඒ නිසා පුස්කොළ පොත් පුරාවිද්‍යාවෙත් ඉතිහාසයෙත් අපේ සංස්කෘතියට ශිෂ්ටාචාරයට ලේඛන කලාව සම්බන්ධයෙන් ඉතාම වැදගත් අංගය හැටියට සලකන්න පුළුවන්. ඒ නිසා මේකට ප්‍රධාන තැනක් දෙන්න ඕනේ.

සෙල්ලිපිවලට දියයුතු තැන ඒකට දෙන්න ඕනේ. නමුත් පුස්කොළ පොත් අපේ උරුමයක්. අපේ දේශීය නිෂ්පාදනයක්. දැන් වෙන කිසිම රටක පුස්කොළ පොත් නැහැ. ඉන්දියාවෙ තියෙන්නේ නියම පුස්කොළ පොත් නෙවෙයි.

තල් හා තල කියල දෙකක් තියෙනවා. තල්වලින් තමයි අපි පුස්කොළ පොත් ලිවුවේ. ඒකට වෙනම තාක්ෂණ ක්‍රමයක් තිබුණානේ. කඩදාසියක ජීව කාලය අවුරුදු 50යි. පුස්කොළ පොත් ශතවර්ෂ ගණනාවක් තියෙනවා. ක්‍රිස්තු වර්ෂ 13 ශතවර්ෂයේ ඉඳල මෙහාට පුස්කොළ පොත් අපිට තියෙනවා. එතකොට එතනින් එහා ඒවත් තියෙන්න තිබුණා, ඒවා හරියට ආරක්ෂා කරල, සංරක්ෂණය කරල තිබුණානම්. නමුත් ඒවා හරියට එහෙම වුනේ නැහැ.

කල්පැවැත්ම අතින් වගේම අන්තර්ගතය අතිනුත් මේක වටිනවා. දැන් හැමදේම අන්තර්ගත වෙලා තියෙන්නේ පුස්කොළ පොත්වලනේ. අපේ ජාතිය, භාෂාව, වෙදහෙදකම, කෑමබීම, සිරිත්විරිත් ආදී සියල්ල තියෙන්නේ පුස්කොළ පොත්වල. ඉතිං ඒක හදාරනව නම් අපේ ඉතිහාසය නිකම්ම එළියට එනවා. ඇත්ත වශයෙන් ම කියනව නම් පුරාවිද්‍යාවේ ඒකට නිසිතැන ලැබිල නැහැ.

පුස්කොළ පොත් දැන් එහෙන්



පුස්කොළ පොත්

මෙහෙන් විශාල ප්‍රමාණයක් ලැබිල තියෙනවා. කොළඹ ජාතික කෞතුකාගාරයේ විශාල ප්‍රමාණයක් තියෙනවා. නමුත් ඒව ගැන තාම ප්‍රමාණවත් තරමට හොයල බලල නැහැ. නමුත් අපිට රටේ නවීන සංවර්ධනයට යොදවගන්න පුළුවන් දේවල් මේවායේ තියෙනවා. ඒත් තාම ඒ ගැන නිසි අවධානය යොමු වෙලා නැහැ.

**පුස්කොළ උරුමයේ චිරජීවනය උදෙසා වගකිවයුතු පුද්ගලයන් හා ආයතන ක්‍රියාකළ යුත්තේ කෙසේද?**

මේකේ වැදගත්කම නොදන්න නිසයි මේක වෙලා තියෙන්නේ. වැදගත්කම දන්නව නම් මේක රැකල ඒකෙන් ගන්න පුළුවන් ප්‍රයෝජනය ගන්නවා. පුස්කොළ පොත්වලින් ප්‍රයෝජන ගන්න පුළුවන් අය අද නෑනේ. පුස්කොළ පොතක් කියවන්න දන්න අය අඩුයි. ඒකේ භාෂාව ගැන අවබෝධයක් තියෙන අයත් ටිකයි. ඉතිං ඒ අවබෝධය තිබුණ නම් අද බටහිර වෙදකම අපිට පරද්දන්න තිබුණ. අපේ තාක්ෂණය, වාස්තුවිද්‍යාව, ඉංජිනේරු විද්‍යාව වැනි සියල්ල ගත්තත් එහෙමයි. නමුත් ඒව හදාරල නිසි අවබෝධයක් අරගෙන වැඩ කරන් නැති එකයි වෙලා තියෙන්නේ. මාධ්‍ය පහසු වෙලා නිසා දැන් අපිට පුස්කොළ ගැන අවධානයක් නැහැ. ඒකයි වෙලා තියෙන්නේ.

එක අතකින් අපි මේව සංරක්ෂණය කරන්න ඕනේ. තියෙන තැන්වලින් හොයල එළියට අරගෙන සංරක්ෂණය කරන්න ඕනේ. එහෙම නැත්නම් ඒ සඳහා සුදුසු ආයතන වලට ඒව අත්පත් කරගෙන ඒ දේවල් කරන්න ඕනේ. සංරක්ෂණය කරල, ගබඩා කරල පුස්තකාලවලට දාල විතරක් බෑ. ඒව පරිහරණය කිරීමේ පාඨක පැලැන්තියක් ඇති කරන්න ඕනේ. මේක කළොත් මේකෙන් ඇති ප්‍රයෝජනය මොකක්ද කියල අවබෝධයක් දීල පාඨකයන්ට යොමු කළොත් මේවායින් ප්‍රයෝජන ගන්න කණ්ඩායමක් සකස් වෙන්න පුළුවන්.

ඒ වගේම මේව පිටපත් කිරීමේ වැඩපිළිවෙලක් තියෙන්න ඕනේ. එහෙම නැත්නම් තියෙන එක මොනවහරි වුනාම ඒක නැතිවෙලා යනවා. කළුමැදීම වැනි දෙයක්වත් කෙරෙන් නෑ. තියෙන තැන්වලම දිරා යනවා. වේයෝ කනවා. මීයෝ කනවා. විනාශ වෙනවා. ඉතිං එහෙම වැඩපිළිවෙලකුත් තියෙන්න ඕනේ. මෙම පිටපත් කිරීම පාසල්වලින් හෝ විශ්වවිද්‍යාලවලින් හෝ පිරිවෙන්වලින් කෙරෙන්න ඕනේ. අද තියෙන තත්වය අනුව ආර්ථික වාසියක් නැත්නම් කිසිදෙයක් කරන්නේ නෑ. කරන්නත් බෑ. ජීවත් වීමේ



කණ්ඨක චේතියේ වාහල්කඩක්

මාර්ගයක් තියෙන්න ඕනෙනේ. ඒකට මොනව හරි සකස් කරන්න පුළුවන් නම් මේක පිටපත් කරන අයට යහපතක් වෙනවා. එතකොට අර පරණ දේවල් පිටපත් කළාට පස්සේ ඒක විනාශ වුනත් අන්තර්ගතය එහෙම නැත්නම් විෂයානුබද්ධ වටිනාකම රැකෙනවා. නමුත් පුරාවිද්‍යාත්මක වටිනාකම නැතිවෙනවා.

ඒ වගේම මේවා ක්ෂුද්‍ර ඡායා පිටපත් කිරීම වැනි විද්‍යුත් මාධ්‍යයකට දාන්න අවශ්‍යයි. ජාතික පුස්තකාලයේ මේක තරමක් දුරට කරනවා. මේක පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, සංස්කෘතික ත්‍රිකෝණය, කෞතුකාගාර දෙපාර්තමේන්තුව, ජාතික ලේඛනාගාරය වැනි ආයතනවලටත් කරන්න පුළුවන්.

ඒ වගේම පන්සල්වල හාමුදුරුවරු, වෙද මහත්වරු, පාඨශාලා ආචාර්යවරු වැනි පුස්කොළ පොත් පිළිබඳ දැනුමක් ඇති ප්‍රභූ අයට මේකේ වටිනාකම ගැන අවබෝධයක් දීල ඒව රැකගන්න සමාජයට දෙන්න වැඩපිළිවෙලක් සකසන්න පුළුවන්. එහෙම කළොත් මේක රැකගන්නත් පුළුවන්, ඒකේ ප්‍රයෝජනය ගන්නත් පුළුවන් ලෝකයට අපේ ජාතික උරුමයේ මෙහෙම දෙයක් තියෙනවා කියල පෙන්වන්නත් පුළුවන්.

ඇත්තටම අපේ පුස්කොළ පොත්වල වටිනාකම දැනගත්තේ බටහිර ජාතිකයන්. ඒකනේ ඒව අරගෙන ගියේ. අපේ පොත් කොච්චර බටහිර පුස්තකාලවල තියෙනවද? ඒ ගොල්ලෝ ඒවායින් ප්‍රයෝජනත් අරගන්නවා. ලන්ඩන් කෞතුකාගාරය වැනි බටහිර කෞතුකාගාර සහ පුස්තකාලවල අපේ පුස්කොළ පොත් විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒවායෙන් ඒ අය පර්යේෂණ කරනවා.

ඒ වගේම මේව විකිනීම, පැහැරගෙන යාම වලක්වන්නත් අවශ්‍යයි. පුස්කොළ පොත් කියල දැන් හොරට පොත් හදනවනේ. ඒවත් වලක්වන්න ඕනේ. මේ මාධ්‍යය සම්බන්ධයෙන් කටයුතු කරන පර්යේෂණ කරන උදවියට හැකි පමණින් රජයෙන් හෝ රාජ්‍ය නොවන සංවිධාන, දානපතියන් යනාදි ආයතන හෝ පිරිස විසින් ඇති තරම් උදව් උපකාර දිරිදීම් කළ යුතුයි.

**ලක්දිව ලේඛනය පිළිබඳ අධ්‍යයන කළ ඔබතුමා ලක්දිව ලේඛනයේ ආරම්භය පිළිබඳව දරන ස්ථාවරය කුමක් ද? අනුරාධපුර ඇතුළුනුවර ක්‍රිස්තු පූර්ව 5 සියවසේ දී අක්ෂර භාවිත වූ බව කියන අදහස ගැන**

ඇත්තෙන් ම දැරණියගල මහතාගේ මතය නිවැරදියි. හරියටම හරි. මං දන්නා තරමින් අක්ෂර සහ ලේඛන කලාවේ භාවිතය ක්‍රිස්තු පූර්ව 5-6 ටත් කලින් වෙන්න පුළුවන්. ඒ අගය දෙන්නේ පුරාවස්තු වල විද්‍යාත්මක පර්යේෂණ වලින් සොයා ගත්තු කාලය අනුවනේ. ඒ නිසා අපි ඒ කාලේ කියලා කියනවානේ. මම හිතන්නෙ ඊටත් කලින් දැං ඉන්දියාවේ ක්‍රිස්තු පූර්ව 9-10 සියවස් වනවිටත් අක්ෂර



අනුරාධපුර වෙස්සගිරියේ ඇති පූර්ව බ්‍රාහ්මී සෙල්ලිපියක්

කලාව ප්‍රචලිතව තිබුණානේ. අර බී. බී. ලාල් වැනි විද්වතුන්ගේ පර්යේෂණය අනුව ඔය අක්ෂර ඒ කාලේ තිබුණා. එතකොට ඒකනේ ගලාගෙන ආවේ අපිට. එතකොට ඒ ශතවර්ෂවල ඉන්දියාවේ තිබුණා කියන්නේ එයින් තහවුරු වෙනවා ඒව අපේ ලංකාවෙත් තියෙන්ට ඇති කියන එක. බ්‍රාහ්මී සෙල්ලිපි වල තියෙන බ්‍රාහ්මී නොවන අක්ෂර ඉතාම වැදගත්. ඒ අක්ෂර ආවේ කොහොම ද? ඒ අක්ෂර සංකේත ක්‍රමයක්නේ එතකොට ඒවා ආවේ කොහොම ද? මං බලලා තියෙන විදිහට ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් ආපු සංකේතවල විකාශනයක්. එතකොට මේක දිගින් දිගටම ඇවිල්ලා තියෙනවා. මේක



පොළොන්නරුවේ ගල්විහාරයේ බුදු පිළිමයක්

අපිට ආවේ දකුණු ඉන්දියාව හරහා ඉස්සෙල්ලා. මිහිඳු හාමුදුරුවෝ මේක ගේන්න ඉස්සෙල්ලා ආව කියලා පී. ඊ. පී. ප්‍රනාන්දු මහාචාර්ය තුමාත් තහවුරු කරලා තියෙනවානේ. එතුමා සාධක සහිතව ඔප්පු කරලා තියෙනවා. මේක මෙහෙමයි වෙන්නේ කියලා. එතකොට ඒ ආවේ ක්‍රිස්තු පූර්ව තුන්වැනි ශතවර්ෂයට ඉස්සෙල්ලා. ඒ ඉන්දියාවේ පාවිච්චි වන අශෝක අක්ෂර වල පාවිච්චි නොවන දකුණු ඉන්දියාවේ පාවිච්චි වන අරිකමේඩු වගේ පළාත්වල පාවිච්චි වන ස්ථාන කීපයක් තියෙනවා. ඒ ස්ථානවල තියෙන ලේඛන අක්ෂර ලංකාවේ තියෙනවා. මේ අක්ෂර උතුරු ඉන්දියාවේ නෑ. ඉතිං ඒකෙන් තමයි තහවුරු වෙන්නේ මිහිඳු හාමුදුරුවෝ එන්ට ඉස්සෙල්ලා මේ අක්ෂර කලාව මෙහාට ආවයි කියලා. වෙළඳුන් මාර්ගයෙන්, සංචාරකයන් මාර්ගයෙන්, වන්දනාකරුවන් මාර්ගයෙන්, පූජකයන් හරහා මේව එන්ට ඇති කියලා විශ්වාස කරනවා. තහවුරු වෙනවා ඒ අක්ෂරවලින්. දකුණු ඉන්දියාවේ තියෙන අක්ෂර මෙහේ තියෙනවා. එතකොට අශෝක ශිලාලේඛනවල තියෙන අක්ෂර සියල්ල අපේ අක්ෂරවල නැහැ. ඒක අක්ෂර හෝඩියක් නම් ඒක එහෙමම එන්න එපායෑ මිහිඳු හාමුදුරුවෝ ගෙනාව නම්. ඒ අක්ෂර සෙල්ලිපිවල නෑ. එතකොට අඩුවක් තියෙනවානේ. එතකොට අර පුරුදු කරගෙන ආ පරිදි මිනිස්සු ලිව්වා. මිහිඳු හාමුදුරුවෝ විධිමත් බ්‍රාහ්මී අක්ෂර හෝඩියක් හඳුන්වා දුන්නා. පසුව වැඩි දියුණු වුනා. එතකොට මෙහේ නැති ඒවා එහේ තියෙනවා. එහේ නැති ඒවා මෙහේ තියෙනවා. දකුණු ඉන්දියාවේ ඒවා මෙහේ තියෙනවා. එතකොට ඒ ඔක්කෝම සම්බන්ධ කරලා ගත්තහම ක්‍රිස්තු පූර්ව 3 ට පෙර සෙල්ලිපි ලේඛන කලාව තිබුණා කියලා පැහැදිලි වෙනවා. ඒ වගේම අපේ මහාවංශය, දීපවංශය වගේ පොත් ගත්තම ඒවායේ සඳහන් ක්‍රිස්තු පූර්ව 6 වන සියවසේ ඉඳලා ලේඛන කලාව තිබුණා කියලා. කථා තියෙනවා. කථාන්දර තියෙනවා. ඒකෙමුත් තහවුරු වෙනවා. ඓතිහාසික අතින්, පුරාවිද්‍යාත්මක අතින් විද්‍යාත්මක අතින් උනත් තහවුරු වෙනවා. අපි කාබන් 14ට දැන්මම ඒවායෙනුත් තහවුරු වෙනවා. බොහෝ කලක් මේවා ගැන හොයලා පර්යේෂණ කරලා ඒ අත්දැකීම් තියෙන විද්වතෙක් නිකම්ම යමක් කියන්නේ නෑනේ. සාක්ෂි ඇතිව, සාධක ඇතිව ඔප්පු කරන්න පුළුවන් නම් තමයි කියන්නේ. ඉතිං ඒක නෑ කියලා කියන්න බෑ. එතුමා ඒක පස්වැනි ශතවර්ෂයේ කියන එක සම්පූර්ණ ඇත්ත. පස්වැනි





පුස්කොළ පොත්

සියවසට ඉස්සර වෙන්නත් පුළුවන්. ඒක තමයි මම මේ පුස්කොළ පොත් සම්බන්ධව කරලා තියෙන පර්යේෂණ අනුව කියන්නේ.

**පුරාවිද්‍යා වෘත්තීය අනන්‍යතාව ස්ථාපිත කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග මොනව කියල ද ඔබතුමා හිතන්නේ ?**

ඔව්, ඇත්තෙන්ම ඔබතුමා කීව කථාව හරියට ම හරි. දැං පුරාවිද්‍යා පර්යේෂණ කරනවා. පුරාවිද්‍යාඥයෝ ඉන්නවා, පුරාවිද්‍යා ශිෂ්‍ය පරම්පරාවක් හදනවා. විශ්වවිද්‍යාලවල වෙනත් ආයතන වල පුරාවිද්‍යාව තියෙනවා නේද? ඒ ඔක්කොම හරි නමුත් පුරාවිද්‍යාඥයාට අද නිසිතැන ලැබිලා නෑ. අද පුරාවිද්‍යාවටවත් ඒක ලැබිලා නෑනේ. මේකේ කුඩම්මගේ සැලකිලි තියෙනවා තාම. මම හිතන්නේ මේ රජයෙන් නම් දැං දැං සැලකිල්ලක් දක්වනවා. දිරිගැන්වීම් කරනවා. පහුගිය කාලේ මුළුල්ලෙම බැලුවොත් අපේ මේ මධ්‍යම රජයෙන් වුණත් මේ පුරාවිද්‍යාව, ඉතිහාසය සමහරු සාහිත්‍ය ආදිය එපා කියල කියනවානේ. එහෙම නායකයොත් හිටියනේ. එහෙම එකේ මේ පුරාවිද්‍යාව දිරිමත් කිරීමක් කරන්නේ කොහොමද? ඒ නිසා තියෙන්නේ මුලින්ම පිළිගැනීමක් ඇතිකරන්න ඕන රජයෙන්. මේක මෙහෙම තත්ත්වයක එකක්, මේක වටිනා එකක් මේකේ වටිනාකම කියා දීලා පණ ගන්වන්න ඕන. ඊට පස්සේ ඔය කියන පුරාවිද්‍යාඥයන්ගේ සභාව කියන එක විධිමත්ව නිසි පරිදි හරියට ක්‍රියාත්මක වෙන්න ඕන. ඒකේ නීති රීති රෙගුලාසි ඔක්කොම තියෙනවානේ. ඒවා ක්‍රියාත්මක වෙන්නේ නෑ. සභාව හරියට රැස්වෙන්නේ නෑ. එතකොට ඒකෙන් හරියට කටයුතු වෙන්නේ නෑ. ඉතිං එහෙමනං සභාවක් තිබ්බට වැඩක් නෑ. එතකොට අනිත් එක ඉන්න පුරාවිද්‍යාඥයන් ටික ඉතිහාසඥයන් කවුරු උනත් කමක් නෑ ඔවුන් අතර එකමුතුභාවයක්, සාමුහිකත්වයක්, තියෙන්න ඕන. එහෙම නැත්තම් මේක කරන්න බෑ. එක එක්කෙනා එක එක පැත්තට අදිනවා නම් මේක කරන්න බෑ. අපි ගත්තොත් වෙනත් වෘත්තිකයන්ට තමන්ගේ සංගමයක් තියෙනවා. සංගමය හරහා ඕනම දෙයක් කරන්න පුළුවන්. වෘත්තීය ගරුත්වය, වෘත්තීය වගකීම ඔක්කොම රැකෙන්නේ එතනින්නේ. අපි පුරාවිද්‍යාව හැදෑරුව අය විදිහට අපේ වගකීම මොකක් ද කියලා අපි දන්නෑ සමහර වෙලාවට. එතකොට අපට වගකියන්න කෙනෙකුත් නෑ. අපිව බලාගන්න කෙනෙකුත් නෑ. එතකොට වෙන්නේ අපි අයාලේ යනවා. එතකොට අයාලේ ගියාම පුරාවිද්‍යාවත් ඉවරයි. අපිත් ඉවරයි. අපේ දැනුමත් ඉවරයි. රටත් ඉවරයි. උරුමයක් කියලා දේකුත් ඇත්තේ නැතිවෙනවා. උත්සාහ කරන්න තියෙන්නෙ අපි අර හොඳ නීත්‍යානුකූල පිළිගැනීමක් ඇතිකරන්න ඕන. පුරාවිද්‍යා සභාවට පුරාවිද්‍යාඥයාට හා පුරාවිද්‍යාවට. එතකොට ඒ තුලින් පුළුවන් අර සංවර්ධන කටයුතු සඳහා යොදාගන්න. මුදල් ඉපැයීමේ කටයුතු සඳහා යොදාගන්න. ආර්ථිකයට දිරිදෙන්න, සංවර්ධනය කරන්න, ලොකු වැඩපිළිවෙලවල් මේ පුරාවිද්‍යාව උරුමය තුළින් සකස්කර ගන්න පුළුවන්. සංචාරකයෙක් ආවොත් මේ රටේ නියම ස්ථාන බලා ගන්න, නියම අවබෝධයක් ලබාගන්න ඒක ගැන දැනුමක් ඇති අය යොදවන්න ඕනේ. සාමාන්‍ය පුද්ගලයන් මග පෙන්වන්නන් විදිහට කටයුතු කරන්නේ. ඉතිං විකාරනේ කියවන්නේ. ඉතිං අර මිනිස්සු යන්නේ ඊට පස්සේ මනස අවුල් වෙලා. ඇයි අහපුදේවල්, කියපුදේවල්, පොතේ තියෙන දේවල් එකට එක වෙනස් නේ. ඉතිං ආපහු එන්නේ නෑ.

**මහාචාර්යවරයෙක් විදියට පර්යේෂණ සම්ප්‍රදාය වර්ධනය කිරීමට කළයුත්තේ කුමක් කියල ද ඔබතුමා හිතන්නේ ?**

මහාචාර්යවරයෙක් වශයෙන් නෙවෙයි, සාමාන්‍ය රටේ පුරවැසියෙක් විදිහට මට පේන්නේ අපේ පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ නියම පුරාවිද්‍යාඥයෝ තවමත් අඩුයි. නෑ කියන්න බෑ. ඉන්නවා,



පොළොන්නරුව වටදාගෙයි කොරවක්ගලක්




හිඟයි. අපේ පුරාවිද්‍යා පර්යේෂණ කණ්ඩායම් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ හරි, සංස්කෘතික ත්‍රිකෝණයෙන් හරි කොහෙන් හරි වගකිවයුතු ආයතනයකින් රජයෙන් හරි විශ්වවිද්‍යාලයකින් හරි පුරාවිද්‍යා පර්යේෂණ කණ්ඩායමක් හදන්න ඕනේ. ප්‍රථම උපාධියෙන් පස්සේ අපි කොහොට හරි යවල පුරුදු පුහුණු කරන්න ඕනේ. අපේ රටේ පුරාවිද්‍යාවේ නියම තත්ත්වය තවමත් නැහැ. අපිට ලෝකේ වෙන රටකට නැති අඛණ්ඩ ලිඛිත ඉතිහාසයක් තියෙනවා. අපේ පුරාවස්තු විවිධ යුගවලට අයත් විවිධ පුරාවස්තු. පුරාවිද්‍යා ස්ථාන, පුරාවිද්‍යා ස්මාරක ඒ සියල්ල අපට තියනවා. වෙන මොන රටේ ද මෙහෙම තියෙන්නේ. අපේ ප්‍රාග් ඉතිහාසය ගත්තහම සිරාන් දැරණියගල මැතිතුමාගේ අදහස අනුව කියන්න පුළුවන් මීට වසර ලක්ෂ 5කට කලින් පැරණි ශිලා යුගයේ සාධක හමුවෙන්න පුළුවන්. එදා ඉඳල අද වෙනකම්ම අපිට තියෙනවනේ අඛණ්ඩ පුරාවිද්‍යාවකුත්. ඒකට සමාන්තරව යන ඉතිහාසයකුත් අපිට තියෙනවනේ. අඩුගානේ ක්‍රිස්තු පූර්ව 6 වෙනි ශතවර්ෂයේ ඉඳලවත් එන. ඒව ඔක්කොමත් තියෙද්දි අපිට හරියට පුහුණුව ලබපු විද්‍යාත්මක ක්‍රම, තාක්ෂණික ක්‍රම, නවීන ක්‍රම යොදාගෙන පර්යේෂණ කරන්න පුළුවන් කණ්ඩායමක් හදාගන්නව නම් මේ රට තමයි ලෝකයේ පුරාවිද්‍යාවේ තෝතැන්න. ඉතිහාසයේ තෝතැන්න. ඉන්දියාවේ වුනත් පර්යේෂණ කටයුතු හරියට කෙරෙන් නෑනේ. ඒ කාලේ කෙරෙන්න ඇති. ඊත් කලින් ලංකාවේ පර්යේෂණ හොඳින් කෙරිල තියෙනවා. පී. ඊ. පී. දැරණියගල, සිරාන් දැරණියගල, පරණවිතාන, සද්ධාමංගල කරුණාරත්න වගේ විද්වතුන් ඇපකැප වෙලා උදේ දවල් රෑ නැතුව ඒ වැඩ කළා. බෙල් වැනි නිලධාරීන් වුනත් එහෙම තමයි. ඒ නිසා අපේ පුරාවිද්‍යාවේ කරපු පර්යේෂණ හුගක් හොඳ මට්ටමක තියෙනවා. පදනම හොඳයි. නමුත් පදනම මත ගොඩනැගිල්ල හරියට හදපු නැති එකයි වෙලා තියෙන්නේ. ඒ නිසා ගොඩනැගිල්ල හරියට හදන්න ඕනේ. හරියට පුරාවිද්‍යාඥයෝ ටිකක් පුහුණු



කණ්ඨක චේතියේ ආයක කැටයමක්

කරගන්න ඕනේ. එක කට්ටියක් හදාගත්තහම දිගින් දිගටම ඒක කරගන්න පුළුවන්. එයින් පසුව පුරාවිද්‍යාඥයන්ගේ සභාව හරහා වෘත්තීය සදාචාරයක් ඇති කරන්න ඕනේ. ඒ වගේම වෘත්තීය පුරාවිද්‍යාඥයනට නිසි තැන නිසි අයිතිය ලබාදෙන්න ඕනේ. එතකොට අපේ පුරාවිද්‍යාව ඉදිරියට ගන්න පුළුවන් වෙයි.

**පර්යේෂණ කිරීම, ශාස්ත්‍රීය පොතපත ලිවීම වැනි කටයුතු වලින් ඔබතුමා මහාචාර්යවරයෙක් වුනා. ඊට අමතරව ඒ කටයුතු සම්බන්ධයෙන් වෙනත් සැලකිල්ලක් ලැබිල නැද්ද?**

ඇත්තෙන්ම සැලකිලි, සම්මාන, ගරුනම්බු ගැන හිතල මම කිසිම දෙයක් කළේ නෑ. නොලැබුණා කියල ප්‍රශ්නයකුත් නෑ. මම කළ දේවල් වලින් මට විශාල ආත්මතෘප්තියක් ලැබෙනවා. මගේ ග්‍රන්ථ දෙකකට රාජ්‍ය සාහිත්‍ය සම්මාන ලැබිල තියෙනවා. ඒ ගැන මම නිහතමානීව සතුටු වෙනවා.

**පර්යේෂකයනට හා යොවුන් පුරාවිද්‍යාඥයනට දීමට ඇති පණිවිඩය?**

පුරාවිද්‍යාව ඉතිහාසය වැනි විෂයයන් හදාරනව නම් මුලින්ම ආත්මාර්තකාමීත්වය අඩුකරගන්න ඕනේ. ආත්මාර්තකාමී බව තිබුනොත් මේ වගේ විෂයයන් හදාරන්න බැහැ. මොකද අපි එතකොට යන්නේ සල්ලි පස්සෙනේ. සල්ලි හොයාගෙන යනවා. සල්ලි හොයාගෙන යනකොට අධ්‍යාපනය පස්සට යනවා. පර්යේෂණ මොට වෙනවා. ඒ නිසා ස්වෙච්ඡාවෙන් ඉදිරිපත් වෙලා තමන් ගැන තමන්ගේ උරුමය ගැන තමන්ගේ රටේ ප්‍රෞඪත්වය ගැන හොයන්න ලොකු හැඟීමක් මමත්වයක් තමන් තුළ ඇති කරගන්න ඕනේ. ඊටපස්සේ තමන් කරන වැඩේ හරියට කරන්න ඕනේ. මොකද යම් පර්යේෂණයක් කරනවනම් මුල ඉඳල අගටම නිසි ලෙස විද්‍යාත්මක ව තාක්ෂණික ක්‍රම පාවිච්චි කරල හරියට කරන්න ඕනේ. ඊට පස්සේ අධ්‍යාපනය කියන එක උපරිමය ලබාගන්න ඕනේ. යන්තම් එහෙන් මෙහෙන් යමක් අහුලගෙන මේ වගේ දේවල් කරන්න බැහැ. ඒ නිසා එයට ඇපකැප වෙන්න ඕනේ. ඇපකැප වීමක් නැතිව මේ වගේ විෂයක් කරන්න බැහැ. තමන් කරන වැඩේ මොන විෂය ද කියල ප්‍රශ්නයක් නෑ. හරියට කළොත් වරදින්නේ නැහැ. ඒ වගේම එයින් රටට ජාතියට ලැබෙන ප්‍රයෝජනයෙත් අඩුවක් නැහැ. ඒ නිසා එතනට අපේ ශිෂ්‍යයෝ එන්න ඕනේ. අද තියෙන ශිෂ්‍ය ව්‍යාපාරය එතන නෙවෙයිනෙ ඉන්නේ. ඒකනේ අද තියෙන ප්‍රශ්නය.

**ආසියානු උරුමය පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය**
**The International Association for Asian Heritage - IAAH**

ආසියානු උරුමය පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ සමාරම්භක රැස්වීම පසුගිය ඔක්තොම්බර් 27 දින බත්තරමුල්ල ඉසුරුපායේදී අමාත්‍ය ටී. බී. ඒකනායක මහතාගේ හා පුරාවිද්‍යාඥයන් ප්‍රමුඛ විද්වතුන් රැසකගේ සහභාගීත්වයෙන් පැවැත්විනි. එහි විශේෂ අවස්ථා කීපයක් පහත ඡායාරූප මගින් නිරූපණය කෙරේ.

















අනුරාධපුර ජේතවන දාගැබ
image courtecy of http://lankapura.com

# තැනිබිමේ මිහිදන් වූ පුරය

කතුවරයාගේ නම සපයාගත නොහැකි වූ Buried Cities of Ceylon නම් පොතින් උපුටාගෙන අනුවර්තනය කළේ
එච්. පී. දයාසිසිර

උතුරු මැද කටුක තැනිතලාවේ පිහිටි අනුරාධපුරය මුල් ම සිංහල පාලන අගනගරය යි. ක්‍රි.පූ. 437 දී එය රාජධානියක් බවට පත් විය. ක්‍රි.ව. 2වන සියවසේ දී අඳින ලද ටොලමිගේ සිතියමේ අනුරාධපුරය දක්වා ඇත්තේ අනුරොග්‍රාමම් යනුවෙනි. ඉන් අදහස් වන්නේ එය ඒ වන විට ද ගමක් වශයෙන් පැවැති බවයි. පුර යන්නෙහි අරුත නගරය හෝ අගනගරය යන්නයි. අනුරාධ ගම අනුරාධ පුරයක් බවට පත් ව ඇති බව එයින් අරුත් ගන්වයි.

ක්‍රි.ව. 4 වන සියවස අගභාගය වන විට මෙම නගරයේ පැවැති ශ්‍රී විභූතිය, චීන දේශාටක ෆාහ්සියෙන් නැමැති උගත් බෞද්ධ භික්‍ෂුව තබා ඇති සටහන්වලින් හෙළි වෙයි. අනුරාධපුරයට ඇති දීර්ඝ හා පෞඪ ඉතිහාසය වෙනත් ජාතීන්ගේ ඉතිහාසයන් හා සසඳන විට විමතිය දනවන සුළු ය. මෙය වරින්වර ආක්‍රමණික පරසතුරන් විසින් වනසන ලදුව සත් වරක් ම යළි නගා සිටුවන ලද නගරයකි. උන්නතිකාමී රාජකීය පෙළපත් ඔවුන්ගේ රාජකීය විජයග්‍රහණයන්ගේ යශෝරාවයන් මෙන්ම ඛේදනීය ඇදවැටීම් ද අනුරාධපුර ඉතිහාසය පුරා සනිටුහන් ව තිබේ. දිවයිනේ ප්‍රමුඛ නගරය ලෙස වසර 1200ක් පැවැති අනුරාධපුරය ක්‍රි. ව. 1071දී අත්හැය යෑමට ලක්වීමෙන් හුදකලා විය.

මෙම (18වන) සියවසේ මැද මංමාවත් තැනීමෙන් ශ්‍රී ලංකාවේ නූතන ඉතිහාසයට එක් වූ මේජර් ස්කිනර් අරිප්පු සිට අනුරාධපුරය දක්වා සැතපුම් 40ක මඟක් තැනීමට සිය බලඇණි මෙහෙයවද්දී දුටු "ගල්ටැම් ලොවක්" නිසා මවිතයට පත් විය. සිය ඇස ගැටුණු ඒ ලෝකයේ තිබුණු පාළුව හුදකලාව නිසා හේ කම්පිත විය.

ස්කිනර්ට වසර 30කට පසු ලීස්චින් (Liesching) නැමැති තරුණ සිවිල් නිලධාරියා සිය හුදකලාව විසින් පොළඹවන ලදුව මෙසේ ලියයි. "අනුරාධපුරය මරණයේ නගරයයි. අතීත ස්මාරකයක් ඇස නොගැටී පියවරක් හෝ තබනු අසීරුය. පාවල ගැටෙනා ගඩොල් කැබලි නටඹුන් රජ මාළිගාවල ශේෂයෝය. කණු, දොරටු පඩි, ගලින් ම කළ දොරටුපාල රූ ඇතැම් තැන්වල මතු වී පෙනෙයි. තෙරක් නැති දැවැන්ත නටඹුන් සමූහය අතර ඇති ගුප්ත නිහැඬියාව අතරින් එදා රජවරුන්, කුමරකුමරියන් මාළිගා අංගන වලින් පුළුල් පැදකුණු මංවලට පිවිස වෙහෙරවිහාර වලට පෙරහැරින් සම්ප්‍රාප්ත වන නාදය නිම්නාද වෙයි."

සෙසු දිස්ත්‍රික්ක හා සසඳන කළ සියවසකට පෙර අනුරාධපුරය සැලකුණේ කිසි කමකට නැති, ව්‍යසනය මිස කිසි වගතුවකට නැති දිස්ත්‍රික්කයක් ලෙසියි. මෙම ප්‍රදේශයේ උන්නතිය සඳහා කෙරුණු දෑ අල්පය. එය ලෝකයාට මුළුමනින් ම වසන්ව තිබුණු ලාංකිකයන් අතර වුව වැඩි දැන හැඳුනුම්කමක් නොතිබුණු වැළලුණු නගරයක් විය.

අනුරාධපුරය ගැන ලිස්චින් තැබූ සමරු සටහන් නිසා"ඈත හා මෑත පෙරදිග පසුගාමී රටවල් " ලෙස බටහිර ලෝකය හඳුනාගෙන තිබූ රටවල ඉතිහාසය හා පුරාවිද්‍යාවගැන ඔවුන් තුළ නව ප්‍රබෝධයක් ඇති විය. ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨ උරුමයන් වෙත නිරායාසයෙන් ම ඔවුන්ගේ විශේෂ අවධානය යොමු විය. ඉන්දියාවේ පුරාවිද්‍යා ගවේෂණ අංශය 1868 දී ස්ථාපිත කෙරුණු අතර ඉන් වසර 7කට පසු ශ්‍රී ලංකාවේ වනගත හුදකලා පෙදෙස්වල තිබූ වැළලුණු නගර හා ධනනිධාන ගැන තොරතුරු රැස්කිරීම ඇරඹිණි. එය බ්‍රිතානීන්ට මහත් ආශ්වාදජනක කටයුත්තක් විය. එවකට ගවේෂණ අධ්‍යක්‍ෂ ලුතිනන් කර්නල් ෆයර් ස්මාරක සංරක්‍ෂණය අරඹුවා පමණක් නොව පුරාවිද්‍යාව පිළිබඳ ව ශ්‍රී ලාංකිකයන්ගේ උද්‍යෝගය ද අවුළුවා ලීය.

ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාව අවශ්‍යයෙන් ම අසහාය මුනිවර බුදුන්ගේ ඉගැන්වීම්, බ්‍රාහ්මන දේව ඇදහිලි, පූර්ව බෞද්ධ සත්ව වන්දනය හා අවියෝජනීය ව බැඳී පවතියි. තවමත් ජීවමාන ආගම් දෙකක් මේවායෙන් සංකේතවත් වෙයි. එම නිසා මෙරට ජනගහණයෙන් බහුතරය මෙම නටඹුන් සලකනුයේ පුරාතන ශිෂ්ටාචාරයක් සනිටුහන් කරන ඓතිහාසික විද්‍යාත්මක සාක්ෂ්‍ය ලෙස නොව සිය ආගමට අයත් ලෝකායත, පූජනීය ස්ථාන ලෙයසි. කලකට ඉහත මළ ආගම් සහිත රටවල කරන අධ්‍යයනවල දී තරම් ඉක්මනින් ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා අධ්‍යයනයන් හා සංරක්‍ෂණයන් කළ නොහැක්කේ එහෙයිනි.



ශ්‍රී මහා බෝධිය 1900-1910
image courtecy of
http://lankapura.com



රුවන්වැලි සෑය
image courtecy of
http://lankapura.com



අභයගිරි දාගැබ
image courtecy of
http://lankapura.com



නටඹුන් පියස්සක් 1908-1909
image courtecy of
http://lankapura.com

# ස්ටෝන් හෙන්ජ් නිඹුල් සොහොයුරා හමු වෙයි

අන්තර්ජාලයේ පළ වූ පුවත් ඇසුරින් සකස් කළේ
මහින්ද කරුණාරත්න




නව ක්ෂේත්‍රයේ පිහිටීම

National Geographic සඟරාවේ 2010 ජූලි 20 දිනැති කලාපයේ Wooden Henge යන ශීර්ෂ පාඨය යටතේ පුවතක් පළවුණා. ඒත් Wooden Henge ගැන කතාකරන්න පෙර Stonge Henge ගැන ටිකක් කතාකිරීම අවශ්‍යම කාරණයක්.

Stonge Henge එංගලන්තයේ විල්ට්ෂයර් (Wiltshire) කියන ප්‍රදේශයේ පිහිටා තියෙන Avebury Hage කියන ප්‍රාග් ඓතිහාසික සමාරක කලාපයට අයත් ප්‍රාග් ඓතිහාසික ස්මාරකයක්. 1986 වර්ෂයේ යුනෙස්කෝව මගින් ලෝක උරුමස්ථානයක් හැටියට නම්කළ මෙම ස්ථානය ලෝකයේ නොදන්නා කෙනෙක නොමැති තරම්. චක්‍රාකාර ලෙස ගල්කණු සිටුවා නිර්මාණය කර ඇති මෙය නවශිලා හෝ තඹ යුගයට අයත් මිනිසාගේ සොහොන්කොත් වටකරගෙනයි පිහිටලා තියෙන්නේ.

පුරාවිද්‍යාඥයන්යෝ විශ්වාස කරන්නේ ක්‍රි.පූ. 2,500 දී විතර මෙම ස්මාරකය ඉදිකරන්නට ඇති බවයි. වටේ දිවෙන පස්වැටිය හා අගල මුල් යුගයේ ඉදිකරන්නට ඇතැයි පැවසෙනවා. ඒ ක්‍රිස්තු පූර්ව 3,100 දී විතර.

වර්තමානයේ Stonge Henge එංගලනත රැජින හා ඉංග්‍රීසි උරුමය යටතේ කළමනාකරණයට ලක්වෙනවා. එරට "Stonge Henge Riverside" ව්‍යාපෘතිය යටතේ විවිධ පුරාවිද්‍යාත්මක අධ්‍යයන සිදුකොට ඇති අතර ඒ යටතේ දී 2003-2008 හා 2010 වර්ෂයන්හි දී සිදුකර ඇති අධ්‍යයන මඟින් වැදගත් තොරතුරු රැසක් අනාවරණය කොටගෙන තියෙන බවයි පෙනෙන්නේ. ඔවුන්ගේ ප්‍රධාන මතය වන්නේ Stonge Henge කියන්නේ ප්‍රාග්ඓතිහාසික මිනිසාගේ සුසානයක් කියන එකයි.

එතකොට මොකක්ද මේ Wooden Henge කියන්නේ. මෑතක දී අනාවරණය වූ Wooden Henge ලොව වැදගත් පුවතක් වීමට ගතවූයේ කෙටි කාලයක් පමණයි. ඒ 2010 ජූලි 22 වෙනි දා බ්‍රිතාන්‍ය ගුවන්විදුලියේ



කැනීම් ස්ථානය

(BBC) ලෝක සේවය, බර්මින්හෑම් විශ්වවිද්‍යාලය, The Gurdian පුවත්පත ආදී ආයතන වාර්තා කළේ පුරාවිද්‍යාඥයන් "ස්ටෝන් හෙන්ජ් නිඹුල්ලු" (Twin stone Henge) සොයාගත් බව යි.

"Stonge Henge Hidden Landscape" නමැති ව්‍යාපෘතිය යටතේ මෙම අනාවරණය කිරීම සිදුකර තිබුණා. ඉංග්‍රීසි උරුම පදනම, ජාතික පදනම (National Trust), බ්‍රැඩ්ෆෝඩ් විශ්වවිද්‍යාලය (Bradford University), බර්මින්හෑම් විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා හා කෞතුකවස්තු පිළිබඳ ආයතනය (Institute of Archaeology and Antiquity of Birmingham University) හා Boltzma Institute for Archaeology Perspective and Virtual Archaeology යන ආයතනයන්ගේ සහයෝගය ඇතුවයි මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවුණේ.

මෙම ව්‍යාපෘතිය 2013 වර්ෂය දක්වා දියත්වන ව්‍යාපෘතියක් වන අතර එහි ප්‍රධාන අරමුණ වී ඇත්තේ වර්ග කිලෝමීටර 14ක් වන Stonge Henge හා අවට භූ දර්ශනය සිතුවම්ගත කිරීමය. ප්‍රාග් ඓතිහාසික ස්ථානයක් ලෙස ස්මාරකය හා අවට පැරණි මානවයාගේ සංචරණ රටාව කෙසේ සිදු වුවාද යන්න සොයාබැලීම පිළිබඳවත් මේ යටතේ දී සැලකිලිමත් වෙනවා.

කොහොම වෙතත් මේ අරමුණු සාක්ෂාත් කරගන්න වෙරදරමින් සිටි ව්‍යාපෘති ප්‍රධානී මහාචාර්ය වින්ස් ගැෆ්නි (Vince Gaffney) ඇතුළු පිරිසට Stonge Henge ස්මාරකයට කිලෝමීටරයක් පමණ දුරින් එයට සමාන තවත් ස්මාරකයක සාධක මතුකොට ගැනීමට හැකිවීම වැදගත් කාරණයක් විය. ස්මාරකය අනාවරණය කිරීමට භූ භෞතික පුරාවිද්‍යා පර්යේෂණ මහත් රුකුලක් වී ඇත. මේ සඳහා Ground–Pehetrating Radar හා Magnetometer භාවිත කර ඇත. මෙම උපකරණ ලබාදුන් දත්ත ඔස්සේ පරීක්ෂා කිරීමෙන් පසු කැනීමට සුදුසු තැන් ඔවුන් තීරණය කළා.

ස්කෝප්ප මඟින් ක්‍රමක්‍රමයෙන් පස් ඉවත්කරගෙන යාමේදී පුරාවස්තු හමුවන්නට පටන්ගත්තා. එමෙන් ම දැව කණු සිටු වූ වළවල් හා අගල් ඇතුළට වන්නට පිහිටා තිබුණා. මෙම වළවල් දැවයෙන් සකස් කළ නිර්මාණයකට අයත් කණු සිටුවා තැබීමට උපකාරී වෙලා තිබෙන බවයි පෙනීගියේ. මෙවැනි දැව කණු සිට වූ



භූ භෞතික ගවේෂණ මඟින් අනාවරණය වූ දත්ත

වළවල් ලංකාවේ අනුරාධපුර ඇතුළුනුවර පුරාවිද්‍යා කැනීම් මගින් ද මීට පෙර වාර්තා වී තිබෙනවා. මෙම ව්‍යුහයට ඇතුළුවීම සඳහා ගිණිකොණ දෙසින් හා නිරිත දෙසින් යනුවෙන් මාර්ග දෙකක් පැවති බව අනාවරණය වුණා. මෙම නව සොයාගැනීම Stonge Henge ස්මාරකයට එක එල්ලේම සමානවෙන එකයි පුරාවිද්‍යාඥයන් විශ්මයට පත් වීම සඳහා හේතු උණේ. ඒ නිසයි ජනමාධ්‍යය විසින් එය " ස්ටෝන් හෙන්ජ් නිඹුල්ලු" යන සුරතල් නාමයෙන් හැඳින් වූයේ. මේ සොයාගැනීම පිළිබඳව අදහස් දැක් වූ මහාචාර්ය වින්සි ප්‍රකාශ කළේ "පසුගිය වසර 50 කාලය ඇතුළත සිදු වූ අදාහාගත නොහැකි අරුමපුදුම සොයාගැනීම මෙය බවයි". මෙම නව Woden Henge නවශිලා හෙවත් නියෝලිතික යුගයට අයත් මානවයා හා සම්බන්ධ ස්මාරකයක් ලෙස හඳුන්වන මහාචාර්ය වින්සි මෙම දැව ස්මාරකය Stonge Henge හා සමකාලීන වියහැකි යැයි තවදුරටක් ප්‍රකාශ කරනවා.



ප්‍රතිනිර්මාණය කරන ලද වුඩ්න් හෙන්ජ්

# වසභ රජු (ක්‍රි.ව 67-111)

ජී.පී. සමීර ප්‍රසංග



වල්ලිපුරම් රන් සන්නස

ලම්භකර්ණ පෙළපතෙහි පළමු වන රජු ලෙස සඳහන් වන වසභ රජු ශ්‍රී ලාංකේය වාරි කර්මාන්ත ක්ෂේත්‍රයේ විශේෂ නමක් සනිටුහන් කළ ශ්‍රේෂ්ඨ පාලකයෙකි. වසභ රජු අයත් ලම්බකර්ණ පෙළපත පිලිබඳව උගතුන් අතර නිශ්චිත අදහසක් නොමැති වුව ද අවම වශයෙන් ක්‍රි.පූ. තෙවන සියවසේ සිටවත් ශ්‍රී ලාංකේය රජුන්ගේ නොමඳ ගෞරවයට හා ප්‍රසාදයට ලක් වූ පිරිසක් වන්නට ඇති බව පූජාවලිය හා සිංහල බෝධිවංසය වැනි සාහිත්‍යය මූලාශ්‍රයගත තොරතුරුවලින් අනාවරණය වේ. පූජාවලියට හා සිංහල බෝධිවංශයට අනුව සුමිත්ත නම් වූ අමාත්‍යවරයා ජය ශ්‍රී මහා බෝධිය පිලිබඳ වාර්තා තැබීමේ තනතුර භාරකර සිටි ජය මහලේනා තනතුර දැරූ පුද්ගලයා ලෙස හඳුන්වා තිබේ. පරණවිතාන සූරීන්ගේ මතය පිළිගතහොත් “ලියන්නා” යන්නට පර්යාය ඉපැරණි බස් වහරේ යෙදුණු “ලේනා” යන්නෙන් ලම්භකර්ණ යන්න බිඳුණෝ වී නම් ලම්භකර්ණ පෙළපත ක්‍රි.පු. තෙවන සියවස තරම් ඈත සියවසකට උරුමකම් කියනු ලබන බව පෙනේ.

ලම්භකර්ණීන්ගේ ආරම්භය පිළිබඳ විවිධ මත පළවුවත් ක්‍රි.ව. පළමු වන සියවස උදාවනවිට ලම්භකර්ණීන් මෙරට රාජ්‍ය බලය ලබාගැනීම දක්වා බලවත්ව සිටි පිරිසක් බව පෙනේ.  ක්‍රි.ව. පළමුවන සියවසේ මුල්භාගයේ රජ වූ ඉළනාග රාජ්‍ය සමයේ මෙරටලම්භකර්ණීන්ගේ පළමු ඉස්මතුවීම දැකගත හැකි වේ. ඉළනාග රජු තම මෞලි මංගල්‍යයෙන් පසු ජලස්නානය සඳහා පිරිස් පිරිවරා තිසාවැවට ගිය අවස්ථාවේ රජු ජලක්‍රීඩාවේ යෙදී මාලිගයට පිටත්වීමට පෙර එම අවස්ථාවට සහභාගී වූ ලම්භකර්ණීන් ඉන් ඉවත්ව ගිය බව සඳහන් වේ. මෙයින් කෝපයට පත් ඉළනාග රජු ලම්භකර්ණීන් විසින් සිදුකළ මෙම ක්‍රියාවට පළිගැනීමක් වශයෙන් තිසාවැව පසෙක ඉදිකරමින් පැවති දාගැබ මෙහෙකරවීම සඳහා සැඩොලුන්ගේ අධීක්ෂණය යටතේ යෙද වූ බව මහාවංසයේ සඳහන් වේ. ඉළනාග රජුගේ ක්‍රියාවට පළිගැනීමක් වශයෙන් ලම්භකර්ණීන් රජු සිරගතකොට තමන්ට රිසිපරිදි අත්තනෝමතික අයුරින් මෙරට පාලනය කළ බව මහාවංසයේ සඳහන් වේ. ඉළනාග රාජ්‍ය සමයේ ඇති වූ මෙම සිදුවීම සමඟ ලම්භකර්ණීන් ගේ ප්‍රබලත්වය මෙරට දේශපාලනයට තදින් දැනෙන්නට වූ බව පෙනේ.

ලම්භකර්ණී පෙළපත මෙරට පාලන බලයට නිසිලෙස උරුමකම් කියනු ලැබුයේ ක්‍රි.ව. 67 දී පළමුවන සියවසේ වසභ රජු රජවීමත් සමඟ ය. වසභ රජුට මෙරට පාලන බලය හිමිවූයේ පාරම්පරික උරුමයකින් නොවේ. මේ හේතුවෙන් වසභ රජු පිළිබඳව මහාවංස කතුවරයා ජනප්‍රවාද හා ජනාශ්‍රැති ගණනාවක් ඉදිරිපත් කරමින් ඔහුගේ රාජකීය උරුමය තහවුරු කිරීමට උත්සහ ගෙන තිබේ. වසභ රාජ්‍යත්වයට පත්වීමට පෙර ජීවත් වූයේ තම මාමණ්ඩියෙකු වූ සුභ රජුගේ සේනාපතිවරයාගේ සෙවනෙහි ය. ජනශ්‍රැතියට අනුව වසභ නමැත්තකු අනාගතයේ මෙරට රජවන බව ඇසූ සුභ රජු මෙරට ජීවත් වූ සියලු වසභවරු ඝාතනය කිරීමට උත්සාහ කළේ ය. වඩාත් රාජ්‍ය පාක්ෂික වූ සුභ රජුගේ සෙන්පති  ධූරය දැරූ වසභ රජුගේ මාමණ්ඩිය තමන් සමීපයෙහි හැදී වැඩුණු වසභ රජුවෙත ඉදිරිපත් කොට මරාදැමීමට උපක්‍රමයක් යොදනු ලැබී ය. නමුත් වසභගේ මාමණ්ඩියගේ බිරිඳ වූ පොත්ථා නමැත්තිය උපක්‍රම ශීලීව වසභ ව එම තර්ජනයෙන් මුදවා දහසක් මුදල් ලබා දී හොර රහසේම නිවසින් පිටමන් කරනු ලැබීය. මහාවිහාර භික්ෂූන් සමීපයට පළමුව ගිය වසභ උන්වහන්සේලාගේ ආශීර්වාදය ලබා රුහුණු දනවුවට පළාගොස් දාමරිකව හැසිරී සේනාවන් ලැබ දෙවසරකින් පැමිණ සුභ රජු හා ඔහුගේ සෙන්පති වූ තම මාමණ්ඩිය මරා මෙරට පාලන බලය ලබාගත්තේය. තමා දුකට පත් වූ අවස්ථාවේදී තමා බේරාගැනීමට උපක්‍රම යෙදූ තම සෙන්පති මාමණ්ඩියගේ වැන්දඹු බිරිඳ වූ (නැන්දනිය) පොත්තා නමැත්තිය වසභ විසින් විවාහකොටගත් බව මහාවංසය සඳහන් කරයි.

නක්ෂශාස්ත්‍රකරුවෙකු වසභ රජුගේ ආයුෂ තවත් දොළොස් වසරක් පමණක් බව ප්‍රකාශකළ බැවින් ආයුෂ වර්ධනය කරගැනීම සඳහා භික්ෂූන් විචාර කල්හි පෙරහන්කඩ දානය, ආවාස දානය, ගිලං වැටුප් දානය, කැඩීබිදී ගිය ආවාස ප්‍රතිසංස්කරණය, පන්සිල් සමාදන්වීම, පොහෝදිනයන්හ පෙහෙවස් සමාදන් වීම ආදී පිංකම් කරන ලෙස භික්ෂූන් අනුදැන වදාළ බව සඳහන් වේ. සිහසුනට පත්වී තුන් අවුරුද්දක් ඇවෑමෙන් වසභ රජු ලක්දිව සියලු සංඝයාට තුන්සිවුරු පූජාකරනු ලැබීය. දෙතිස් ස්ථානයක මිහිරි කිරිබත් දානයක් දෙනු ලැබී ය. ස්ථාන 64ක දී මිශ්‍රක මහාදාන පැවැත්වීය. සෑගිරි විහාරය (මිහින්තලය), ථූපාරාම චෛත්‍යය, මහාසෑය (රුවන්වැලිසෑය), ජය ශ්‍රී මහා බෝධිය යන ස්ථාන හතරෙහි පහන් දහස බැගින් දැල්වූයේය. සිතුල්පව් විහාරයේ ඉතා අලංකාර සෑ 10ක් ද වල්ලියේර නම් විහාරයේ තෙරුන් පිළිබඳ පැහැදී මහාවල්ලිගොත්ත නම් විහාරය ද මාගම අනුරාරාම විහාරය ද කරවා ඊට හේලිනම් ගමෙහි කිරිය අටදහසක් ද පූජාකරවීය. තිස්සවඩ්ඩමාන නම් ස්ථානයෙහි මුචේල නම් විහාරයක් කරවා විහාර නඩත්තුවට ඇලහැර ඇලේ ජලබද්ධ ලබා දුන්නේය. ගලඹතොට නම් සෑයේ උළුවැස්ම ද පොහොයගෙය ද පොහොය ගෙයිහි වැටිතෙල් පිණිස දහස්කිරි නම් වැවැක් ද කරනු ලැබී ය. කුඹුගල විහාරයෙහි පොහොයගෙය, ඉසුරුමුණි විහාරයෙහි පොහොයගෙය, ථූපාරාමහෙහි දානගෙය මහාවිහාරයෙහි බටහිර දෙසින් පිහිටි පිරිවෙණ සතර ශාලාව ද මහබෝමළුවේ සතර බුදුවරුන්ගේ අත්‍යලංකාර ප්‍රතිමා සතරක් ද වසභ රජු විසින් පිහිටුවීය.

වසභ රජු විසින් කළබව කියවෙන ශාසනික සේවාවන් රාශියක් පිළිබඳ මහාවංසය තොරතුරු මඟින් අනාවරණය කරගත හැකි ය. වසභ රජුගේ ශාසනික සේවය පිළිබඳ ඔහුගේ අභිලේඛන තුළින් ද තොරතුරු අනාවරණය කරගත හැකිය. වසභ රජුගේ අභිලේඛන දිවයිනේ සෑම ප්‍රදේශයකින්ම පාහේ හමු වී තිබෙන බැවින් වසභ රජු ගේ බලය දිවයින මුළුල්ලෙහිම ව්‍යාප්තව තිබෙන්නට ඇතැයි විශ්වාස කිරීමට පිළිවෙන. නැගෙනහිර පළාතේ මඩකලපු දිස්ත්‍රික්කයේ මුචේල විහාර ලිපිය, යාපන අර්ධද්වීපයෙන් හමු වු වල්ලිපුරම් රං සන්නස, අනුරාධපුරයේ පෙරුමියන්කුලම් පර්වත ලිපිය, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගලඋඩ විහාර ලිපිය, දකුණු පළාත සිතුල්පව්ව විහාර ලිපිය ආදී අභිලේඛන වසභගේ වැදගත් අභිලේඛන තන්හි ලා සැලකිය හැකිය.

වසභ රාජ්‍ය සමය මෙරට වාරි ඉතිහාසයේ විශේෂ සන්දිස්ථානයක් පෙන්නුම් කළේය. වැව් 11ක් හා ඇලමාර්ග 12ක් වසභ විසින් ඉදිකළ බව මහාවංසයේ සඳහන් වේ. මහවිලච්චිය වැව, මාන්නන්කැටිය වැව, කාලියවදන වැව, නොච්චිපතාන වැව, හිරිවඩුන්න වැව, කලාබළලු වැව හා ඇළිසාර හෙවත් ඇළහැර ඇළ යන වැව් හා ඇළ මාර්ගය වසභ රජු විසින් ඉදිකළ වැදගත් වාරිකර්මාන්ත අතර වේ. උමන් මඟින් පොකුණු සඳහා ජලය ගෙනයාමේ ක්‍රමයක් ද  වසභ රාජ්‍ය සමයේ දී සැකසුණු බව මහාවංසය විස්තර අනුව පැහැදිලි වේ.



ඉසුරුමුණි විහාරය

ශ්‍රී ලාංකේය පුරාවිද්‍යාවට මෙහෙවරක්

# දිනිති - ශ්‍රී ලාංකේය පුරාවිද්‍යාව

පුරාවිද්‍යාව සම්බන්ධයෙන් සංවිධානය කරන සම්මන්ත්‍රණ, වැඩමුළු හෝ වෙනත් පුරාවිද්‍යාව හා සම්බන්ධ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් [www.archaeology.lk](http://www.archaeology.lk) හෝ [si.archaeology.lk](http://si.archaeology.lk) වෙබ් අඩවිවල හෝ *දිනිති-ශ්‍රී ලාංකේය පුරාවිද්‍යාව* විද්‍යුත් සඟරාවේ නොමිලයේ පළකර ගැනීම සඳහා ඒ පිළිබඳ විස්තර අප වෙත ලැබීමට සලසන්න.



ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පුරාවිද්‍යාව, ඉතිහාසය, මානවවිද්‍යාව, මානවවංශ විද්‍යාව ඇතුළු පුරාවිද්‍යාව හා සම්බන්ධ ඕනෑම විෂයක් සම්බන්ධයෙන් ඔබ විසින් ලියන ලද ලිපි *දිනිති - ශ්‍රී ලාංකේය පුරාවිද්‍යාව* විද්‍යුත් සඟරාවේ පළ කිරීම සඳහා බාර ගැනේ.

ප්‍රවීන, නවක ඔබ විසින් ලියන ලද තේමානුගත හෝ කාලීන ලිපි අප වෙත යොමු කරන්න.

**විද්‍යුත් ලිපිනය**
[dinithi@archaeology.lk](mailto:dinithi@archaeology.lk)

**තැපැල් ලිපිනය**
සංස්කාරක
දිනිති
අංක 47,
ශ්‍රී සුමංගල මාවත-දකුණ,
කළුතර-උතුර

දිනිති පසුගිය කලාප ලබාගැනීම සඳහා

[http://www.archaeology.lk/dinithi/](http://www.archaeology.lk/dinithi/)

[http://si.archaeology.lk/?page_id=921](http://si.archaeology.lk/?page_id=921)

ශ්‍රී ලාංක්ය පුරාවිද්‍යාව වෙනුවෙන් වෙන් වූ දිනිති පුරාවිද්‍යා විද්‍යුත් සඟරාවේ තත්ත්වය ප්‍රමාණාත්මක හා ගුණාත්මක වශයෙන් ඉහළ නැංවීම සඳහා ඔබගේ අදහස් අත්‍යවශය වී ඇත.

දිනිති සඟරාව සම්බන්ධයෙන් ඔබගේ අදහස්, යෝජනා හා විවේචනාත්මක අදහස් අප වෙත දන්වා එවන්න.

## දිනිති කණ්ඩායම


චන්දිම අඹන්වල


අනුරාධ පියදාස


මහින්ද කරුණාරත්න


සන්ධ්‍යා නවරත්න


**සංස්කරණය**
චන්දිම අඹන්වල
chandima@archaeology.lk

**කර්තෘ මණ්ඩලය**
මහින්ද කරුණාරත්න
mahinda@archaeology.lk

**සංස්කාරක මණ්ඩලය**
අනුරාධ පියදාස
anuradha@archaeology.lk

සන්ධ්‍යා නවරත්න-මැණිකේ
sandya@archaeology.lk

**විවිධ සහාය**
රුක්ෂිලා වෙත්තමුණි
rukshila@archaeology.lk

ලක්ෂ්මී විජයරත්න
lakshmi@archaeology.lk

**අංකිත සිතුවම්කරණය**
අනුරාධ පියදාස
anuradha@archaeology.lk